**වයඹ පළාත් සභාව - 2023**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වයඹ පළාත් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 31දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශීර්ෂ අංක 213 - පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අදාලව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් වූ රු.28,063,378 ක් සහ කලින් ගෙවූ වියදම් වූ රු.611,181 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | අදාළ උපලේඛන සකස් කිරීමේදී ප්‍රමාද දෝෂයකින් 213 ට අදාළ ගෙවියයුතු වියදම් හා කලින් ගෙවීම් අත්හැරී ඇති බවත්, 2024 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී, 2023 ට අදාළ සංසන්දනාත්මක දත්තයන් සංශෝධනය කොට ඇතුලත් කිරීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | මූල්‍ය වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ කාර්යාල ගොඩනැගිලිවලට අදාලව ගිණුම් ඒකක විසින් කරන ලද රු.76,762,840 ක් වූ ගැලපීම් සඳහා සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | කාර්යාල ගොඩනැගිලි - රු.76,762,840.00 සඳහා වන පැහැදිලි කිරීම් පසුව ලබා දෙන බව දන්වා ඇත. | විගණනය වෙත නිවැරදි තොරතුරු කාලීනව ඉදිරිපත් කළ යුතු අතර සියලු ශේෂයන් සඳහා සනාථ කිරීම් තිබිය යුතුය. |
| **(ඇ)** | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය - ඒ.සී.ඒ 6 ආකෘතියේ ඇති එකතුව රු.23,152,346,099 ක් වූ වත්කම් කාණ්ඩ 07 ක ශේෂයන් තහවුරු කර ගැනීම සඳහා වූ ලේඛන, උපලේඛන හා වටිනාකම සනාථ කර ගැනීමට අදාළ විගණන සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොවුණි. | නිවැරදි උපලේඛන ඉදිරියේදී ඉදිරිපත් කරන බව දන්වා ඇත. | විගණනයට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. |
| **(ඈ)** | 2023 දෙසැම්බර් 29 දිනැති අංක 2023/05 දරන පළාත් භාණ්ඩාගාර (ගිණුම් හා ගෙවීම්) මාර්ගෝපදේශයේ 8.1 ඡේදය ප්‍රකාරව තවදුරටත් වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් හඳුනාගෙන ඒවා නිවැරදි අගයට ගිණුම් ගත කළ යුතු වුවත් 2021 හා 2022 වර්ෂවල පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව සඳහා පරිත්‍යාග ලෙස ලද වතුර මෝටරයක්, රෝද පුටුවක් හා හයිඩ්‍රෝබාත් උපකරණයක අගය කර ගිණුම්ගත කර නොතිබුණි. | පරිත්‍යාග ලෙස ලද වතුර මෝටරයක සහ රෝදපුටුව හා හයිඩ්‍රෝබාත් උපකරණය වත්කම් ලේඛනයට ඇතුලත් කර ඇත. 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඉ)** | ශීර්ෂය 260 - ප්‍රධාන ලේකම් කාර්යාලයේ ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව, රු.71,175,676 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය අනුව එම ශේෂය රු.72,039,616 ක් වූයෙන් රු.863,940 ක නොසැසඳීමක් විය. | වත්කම් ප්‍රධාන ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඒකාබද්ධ කර දක්වා ඇත. | තවදුරටත් පවතින නොසැසඳුම් හඳුනා ගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට/පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට (අදාළ පරිදි) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරිත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව වයඹ පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1. ශීර්ෂය 201 - වයඹ ආණ්ඩුකාරවරයා

#### 1.5.1.1. නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව හා අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ඔක්තෝබර් මස 12 වන දිනැති අංක PS/CSA/11-18 දරන ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ පෞද්ගලික කාර්යය මණ්ඩලයේ 15 දෙනෙකුගෙන් සේවකයින් 10 දෙනෙක් අදාළ සුදුසුකම් සපුරා නොතිබිය දී බඳවාගෙන 2023 මැයි සිට දෙසැම්බර් දක්වා වැටුප් ලෙස එකතුව රු.2,407,368 ක් ගෙවා තිබුණි. | ගරු ආණ්ඩුකාරතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ රියදුරු, අරක්කැමි, කාර්ය සහායක හා අනෙකුත් කාර්ය මණ්ඩළය පත්කිරීමේදී ගරු ආණ්ඩුකාරතුමාගේ ආරක්ෂාව හා විශ්වාසවන්තභාවය යන කරුණු ද පෞද්ගලික හේතූන් ද සළකා, ආණ්ඩුකාරවර ධූර කාලය අවසානයේ දී මෙම තනතුරු අවසන් වීමද යන කරුණු පදනම් කර ගනිමින් මෙම අයට අධ්‍යාපන සුදුසුකම් නොසළකා පත්වීම් ලබා දීමට ගරු ආණ්ඩුකාරතුමා නියෝග කර ඇති අතර එම නියෝගය පරිදි මෙම පත්වීම් ලබා දී ඇති බව දන්වා ඇත. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |

#### 1.5.1.2 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආණ්ඩුකාරවර කාර්යාලය සතුව පැවති රු.13,790,000ක් දරන මර්සිඩීස් බෙන්ස් කාර් රථය 2013 වර්ෂයේ වයඹ ප්‍රධාන ලේකම් වෙත භාර දී තිබුණ ද, අයිතිය විධිමත්ව පවරා දී නොතිබුණු අතර, එම වාහනය පළාත් සභා භූමියේ නිශ්කාර්යව අනාරක්ෂිතව ගාල් කර තිබුණි. | මර්සිඩීස් බෙන්ස් කාර් රථයේ මුල් හිමිකාරීත්වය ආණ්ඩුකාරවර කාර්යාලය සතු වුවද, 2013 ජනවාරි 04 දින ප්‍රධාන ලේකම් කාර්යාලයට භාර දී ඇති බව දන්වා ඇත. | වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පවත්වා නොගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.1.3 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හිටපු ආණ්ඩුකාරවරයකු විසින් භාවිතා කරන ලද මෝටර් රථය 2020 ජූලි 01 දින අනතුරකට පත්වී තිබුණු අතර, එම මොටර් රථය අළුත්වැඩියා කිරීම සඳහා රු.5,286,460 ක් පළාත් සභාව විසින් දරා තිබුණද, රක්ෂණ ආයතනයෙන් ලැබී තිබුණේ රු.3,865,731 ක් පමණක් බැවින් ඉතිරි මුදල් වූ රු.1,420,729 ක් රියදුරාගෙන් අය කිරීමට තිරණය කර තිබුණද, විගණිත දිනය වූ 2024 මාර්තු 06 දින වන විටත් එම මුදල් අය කරගෙන නොතිබුණි. | එම මුදල අය කර ගැනීම සම්බන්ධයෙන් රියදුරු මහතාට විරුද්ධව කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇති බවත්, නැවත නඩුව 2024 නොවැම්බර් 27 දිනට කැඳවීමට නියමිතව ඇති බවත්. එම නඩුවේ තීරණය අනුව ඉදිරි කටයුතු කරන බවත් දන්වා ඇත. | පාඩු හා හානි අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.2 ශීර්ෂය 202 - පළාත් සභාව**

**1.5.2.1 නොවිසඳී ඇති විගණන ඡේද**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාත් සභා ලේකම් කාර්යාලයේ ප්‍රයෝජනයට ලබා දී තිබුණු වාහනයක් විධිමත් අනුමැතියකින් තොරව පළාත් සභාවේ නියෝජ්‍ය සභාපතිනිය වෙත ලබා දී තිබියදී 2002 ඔක්තෝබර් 11 වන දින එම රථය අනාරක්ෂිතව ගාල් කර තිබිය දී සම්පූර්ණයෙන්ම ගිනිගෙන විනාශයට පත් වීමෙන් සිදු වූ අලාභය 2024 ජනවාරි 19 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ වන තෙක් එම නඩු තීන්දුවේ පිටපතක් හෝ පවතින වර්තමාන තත්වය පිළිබඳ තොරතුරු ලැබී නොමැත. | නඩු තීන්දුවේ පිටපතක් ලබාගෙන අලාභය අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

**1.5.3 ශීර්ෂය 203 - රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**1.5.3.1 නොවිසඳී ඇති විගණන ඡේද**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වයඹ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් ඉබ්බාගමුව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකට විගණනය විසින් පෙන්වා දී පරීක්ෂණ මණ්ඩලය මඟින් තහවුරු කළ මූල්‍ය අලාභය වූ රු.2,564,595 ක් විෂය ලිපිකරුවන් 04 දෙනෙකුගෙන් පමණක් අයකර ගැනීමට කටයුතු කර තිබුණු නමුත්, එක් නිලධාරියෙකුගෙන් රු.1,084,712 ක් අයවී නොතිබුණි. එමෙන්ම එම විශේෂ පරීක්ෂණ වාර්තාවෙහි අංක 04 වගකීම පැවරීම තුළ අදාළ මූල්‍ය අක්‍රමිකතාවය සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ගේ නම් ලැයිස්තුවක් අදාළ කරුණු අනුව දක්වා තිබුණද, අනෙකුත් වගකිව යුතු නිලධාරි සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ජී.එස්.එස්.ධර්මතිලක මියගෙන් අයවිය යුතු මුලු මුදලින් රු.640,000 ක මුදලක් 2024 මැයි මාසය වන විට අයකර ඇති අතර තව දුරටත් අයවිය යුතු මුදල රු.839,712 ක් බව දන්වා ඇත. | විශේෂ පරීක්ෂණ වාර්තාවේ සඳහන් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ |
| (ආ) | ඉබ්බාගමුව කලාප අධ්‍යාපන කාර්යාලයේ මූල්‍ය වංචාව සම්බන්ධ විශේෂ පරීක්ෂණ වාර්තාවෙහි අවසන් වශයෙන් ජාතික විගණන කාර්යාලයෙහි විගණන විමසුමෙහි සඳහන් කරුණු මත පමණක් පදනම්ව පරීක්ෂණය සිදුකළ බවත්, එමෙන්ම මේ සඳහා දීර්ඝ පරීක්ෂාවක් සිදුකළ යුතු බවත් පරීක්ෂණ වාර්තාවෙහි දක්වා තිබුණි. එවැනි පරීක්ෂණයක් සිදු කිරීමට අදාළ වගකිව යුතු නිලධාරීන් කටයුතු කර නොතිබුණි | ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා ඇත. | ඒ සම්බන්ධයෙන් ගැඹුරු පරීක්ෂාවක් සිදුකළ යුතුය. |

**1.5.4. ශීර්ෂ ය 210 - වයඹ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලප්‍රවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යවරයා.**

**1.5.4.1 අපේක්ෂිත නිමවුම් (out put) ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජනකලා කේන්ද්‍රයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා 2017 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා රු.209,673,158 ක වියදමක් දරා තිබුණු නමුදු, 2023 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ව්‍යාපෘතිය අතරමඟ නැවතී තිබුණි. මෙම ගොඩනැගිල්ල නැවත ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා 2021 වර්ෂයේ මෙන්ම සමාලෝචිත වර්ෂයේ ද රු.734,376 ක් වියදම් කරමින් පුවත්පත් දැන්වීම් පලකර තිබුණද, පෙර පැවති තත්ත්වය වර්තමානය වන විටත් පැවතීම හේතුවෙන් මෙම වියදම ද මේ වන විට නිෂ්කාර්යය වියදමක් බවට පත්ව තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයන් නිවැරදිව සිදු නොකිරීම තුළින් මෙම තත්ත්වය ඇති වී තිබුණි. | නිරීක්ෂණ පිළිගෙන ඇත. රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්වය (PPP) මඟින් යෝජිත, ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇති බවත්, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බවත් විගණනයට දක්වා තිබුණි. | මුදල් ආර්ථිකව කාර්යක්ෂමව සහ ඵලදායීව භාවිතා කළ යුතුය. |

**1.5.4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) වයඹ පළාත් සභාව සහ කුරුණෑගල මහා නගර සභාව ඒකාබද්ධව ඉදිකරනු ලබන සය මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය** | | |
| මෙම කොන්ත්‍රාත්තුව සැලසුම් කළ කාලසීමාව තුළ ආරම්භ නොකිරීම හා ප්‍රමාද වී ආරම්භ කිරීම තුළින් රු.13,196,156 ක් වූ මිල විචලනයක් ගෙවීමට සිදු වීමෙන් පළාත් සභා අරමුදල සඳහා අමතර වැය බරක් දැරීමට සිදු වී තිබුණි. | සැලසුම්කල කාල වකවානුව තුල ඉදිකිරීම් ආරම්භ කිරීම ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගය මත 2019.12.20 දින නවත්වන ලද බවද, නැවත ගරු ආණ්ඩුකාරතුමාගේ 2020.01.06 දින ආරම්භ කිරීමට දන්වා ඇතිබවද, එමෙන්ම කොවිඩ් වසංගත තත්ත්වය නිසා පනවන ලද සෞඛ්‍ය නීතිරීති තත්ත්වය හා සීමාවන් නිසා මෙය පාර්ශව දෙකටම පාලනය කිරීමට නොහැකි වීම යන කරුණු වේ. මිල විචලනය ගෙවීම් | ව්‍යාපෘති නියමිත කාල රාමු තුළ ඉටුකිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සිදුකරනු ලබන්නේ කොන්ත්‍රාත් කොන්දේසි ප්‍රකාරව පමණක් බව සඳහන් කර ඇතිබව දන්වා ඇත. | |
| **(ආ)** | ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු වෙත 2020 දෙසැම්බර් 24 දිනට ලබාදී තිබුණු අත්තිකාරම් මුදල වූ රු.185,124,755 ක මුදලින් ගෙවන ලද අටවන (08) බිල්පතෙහිදී රු.24,237,977 ක මුදලක් පමණක් අයකර තිබුණි. ඒ අනුව ගිවිසුම්ගත වූ දින සිට විගණිත දිනය වූ 2023 නොවැම්බර් 28 දින දක්වා කොන්ත්‍රාත්කරුගෙන් අය නොකර සිටින අත්තිකාරම් මුදල රු.160,886,778 ක් විය. | කොන්ත්‍රාත්තුවක අත්තිකාරම් අය කිරීමේ ක්‍රමවේදය කොන්ත්‍රාත් කොන්දේසි 14.2හි පැහැදිලිව දක්වා ඇති බවද, ඒ අනුව කටයුතු කර ඇති බවද, කොන්ත්‍රාත්තුව අවසන් කිරීමෙන් පසු හිඟ අත්තිකාරම් මුදල් අයකර ගැනිමේ දැනුම් දීම නියමිත බැංකුවලට දැනුම් දී ඇති බවද, කොන්ත්‍රාත්කරු විසින් අතුරු වාරණ නියෝගයක් කොළඹ දිසා අධිකරණයෙන් ලබාගෙන එම අත්තිකාරම් හා කාර්යසාධන ඇපකරයන් අයකර ගැනිම තාවකාලිකව අත්හිටුවා ඇති අතර එම ක්‍රියාවලිය අවසන් වූ වහාම එම අය කිරීම් නිර්ණය කර අවසන් ගෙවීම් සහතිකයක් මඟින් සේව්‍යයාගේ සියළු හිමිකම් ලබා ගැනිමට කටයුතු කරමි. නමුත් මෙම අත්තිකාරම් මුදල් ගෙවීමෙන් අනතුරුව පළාත් සභා වෙත පියවා ගැනිම කොන්ත්‍රාත්තු අවසන් කිරීමකින් තොරව සිදුකල නොහැකි බව සඳහන් කර ඇත. | ගෙවන ලද අත්තිකාරම් මුදල අයකරගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | අත්තිකාරම් ගෙවීමේදී පළමු අත්තිකාරමට අදාළ වන රු.92,562,377 සඳහා එකතු කළ අගය මත බදු 15% ක් සඳහා රු.13,884,356 ක් ගෙවා තිබූ අතර, ගොඩනැගිල්ල ඉදිකිරීම් ආරම්භ වන අවස්ථාවට පෙර එකතු කළ අගය මත බදු සියයට 08 ක් දක්වා අඩුකර ඇති බැවින් අත්තිකාරම සඳහා වන බදු අදාළ රු.7,404,990 ක් වන බැවින් VAT බදු ලෙස වැඩිපුර ගෙවා ඇති මුදල රු.6,479,366 ක් විය. | ගෙවීම් බිල්පත් සිදු කිරීමේදි ගෙවිය යුතු මුදලට එවකට ගෙවිය යුතු වැට් බදු ප්‍රතිශතය එකතු කර ගෙවීම් සිදු කළ යුතුය. රජය විසින් කලින් කලට වැට් බදු ප්‍රතිශතය වෙනස් කිරීමේදී එම වැට් නිශ්කාශණය කිරිම අප විසින් සිදු නොකරන අතර ඒ සඳහා පූර්ව බලය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු බව දන්වා ඇත. | නියමිත වූ අනුපාත අනුව බදු ගෙවීමට කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | උක්ත ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් ගිවිසුම් කොන්දේසි අංක 15(1) හා 15(2) (a) (b) වල සඳහන් හේතූන් මත කොන්ත්‍රාත්තුව අවලංගු කළ හැකි බව නීතිපති දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත 2022 ඔක්තෝබර් 05 | කොන්ත්‍රාත්කරු විසින් 2022 ඔක්තෝබර් 14 දින කොළඹ දිසා අධිකරණයේ ඍජුව නඩු පවරා ඇති අතර, 2023 මැයි 31 දින එම නඩුවේ තීන්දුව ප්‍රකාශ කරමින් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා | ගිවිසුම් කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| දින කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ (Termination) නිවේදනය නිකුත් කර තිබුණ අතර, 2022 ඔක්තෝබර් 06 දින බැංකු සුරක්ෂණය නිදහස් කරන ලෙස වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් බැංකු වෙත දන්වා තිබුණි. 2022 ඔක්තෝබර් 14 කොන්ත්‍රාත්කරු විසින් බැඳුම්කර මුදල් නිදහස් කිරීම අත්හිටුවමින් උසාවි නියෝගයක් ලබාගෙන තිබුණු මුත්, එය කොළඹ දිසා අධිකරණය විසින් 2023 මැයි 31 දින නිෂ්ප්‍රභා කර තිබුණි. ඒ අනුව, වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් නමට වූ එකතුව රු.260,618,293 ක් වටිනා බැඳුම්කර 03 ක් නිදහස් කර ගැනීමට අදාළ අවස්ථාවන් වලදී වගකිව යුතු පාර්ශව කටයුතු කර නොතිබුණි. | කර ඇත. එදිනම ප්‍රධාන අමාත්‍යාංශය විසින් බැංකුවට අදාළ බැඳුම්කර මුදල් කර දෙන ලෙස ලිපි ඉදිරිපත් කර ඇති බව දන්වා ඇත. | |

**1.5.5. ශීර්ෂය 211 - වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව**

**1.5.5.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1996 වර්ෂයේ සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ වයඹ පළාතේ පළාත් පාලන ආයතනවල කටයුතු සම්බන්ධයෙන් විගණකාධිපති විසින් නිකුත් කර තිබුණු එකතුව රු.3,325,756 ක් වූ අධිභාර සහතික 07 ක් සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග වගකිව යුතු පාර්ශවයන් විසින් ගෙන නොතිබුණි. | පළාත් පාලන ආයතන 03 ට අදාළ මෙම අධිභාර සහතික 07 සම්බන්ධයෙන් ලබා දී ඇති තීරණ අනුව අය කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන බව දන්වා ඇත. | අධිභාර අයකර ගැනීම සඳහා කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය |

**1.5.6. ශීර්ෂය 212 - වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව**

**1.5.6.1. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කළ බිහල්පොල සෞඛ්‍ය වෛද්‍ය | විගණන විමසුම් සඳහා පිළිතුරු ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා | ව්‍යාපෘති ඉටුකිරීමේ ආර්ථිකමය |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලය ඉදිකිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ රු 21,472,169 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම් ගතව 2023 නොවැම්බර් වන විට රු.16,196,304ක වැඩ කොටස් නිමකර තිබූ අතර, රු.6,060,918 ක මිල විචලනය ගෙවීම් සමඟ එකතුව රු.22,257,222 ක් ගෙවා තිබූ හෙයින් මිල විචලනය කොන්ත්‍රාත් වටිනාකමින් සියයටට 28 ක් විය. මෙම කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුවෙන් ඉවත් වීම හේතුවෙන් ඉතිරි වැඩ සඳහා නැවත ලංසු කැඳවා වෙනත් පුද්ගලික ආයතනයක් සමඟ නව ගිවිසුමකට එළඹීමට සිදු වීමෙන් එම කාර්යය අවුරුදු 1 මාස 7 කාලයක් ප්‍රමාදව තිබූ අතර කළවැඩ සඳහා මුලික පිරිවැය රු.626,000 ක් නැවත දැරීමට සිදුවීමෙන් රජයට එම මුදලින් අලාභයක් සිදුව තිබූ අතර පළමු අවස්ථාවේ රු.3,282,270 ක් වූ ඉතිරි වැඩ සඳහා නව කොන්ත්‍රාත්කරු සමඟ රු.16,698,451 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම් ගතවීමට සිදුවීමෙන් රජයට රු.13,416,182 ක පාඩුවක් දැරීමට සිදුවී තිබුණි. | අධ්‍යක්ෂවරුන් වෙතින් ලැබී නොමැති හෙයින් ඒ සඳහා කඩිනමින් පිළිතුරු ලබාගෙන කඩිනමින් පිළිතුරු ලබාදෙන බව දන්වා ඇත. | කාර්යක්ෂමතාව හා ඵලදායි ආකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාගැනීමට හැකිවන ආකාරයට ඉටුකළ යුතු වීම. |
| **(ආ)** | 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ඉදිකිරීම් කටයුතු කරමින් පවතින කොන්ත්‍රාත් වටිනාකම රු.155,911,068 ක් වූ ගොකරැල්ල දිස්ත්‍රික් රෝහලේ ප්‍රාථමික සත්කාර ඒකකය ඉදිකිරීම සම්බන්ධයෙන් භෞතික පරීක්ෂාවේදී Record Room (වාර්තා කාමරය) සායන ගොඩනැඟිල්ල, රුධිරය එකතු කිරීම් ඒකකය, සුළු කාර්ය මණ්ඩල, විවේක කාමරය යන ස්ථානයන්හි බිත්ති වල පිපිරීම් හා ඉරිතැලීම් දක්නට ලැබුණු අතර සුළු කාර්ය මණ්ඩල විවේක කාමරයෙහි නාන කාමරයේ ටයිල් පුපුරාගොස් තිබුණු බව හා රෝහල් අධ්‍යක්ෂ කාමරයෙහි බිත්ති සඳහා යොදා තිබූ ටයිල් බොල් වී ඇති බව දක්නට ලැබුණි. | ගොඩනැඟිල්ලේ Slab එක හිරු එළියට නිරාවරණය වීම, ගොඩනැඟිල්ලේ දොර, ජනේල් වසා තැබීම ආදී හේතු නිසා වැඩි ප්‍රසාරණයට හේතුවීම, ටයිල්, ගඩොල්, කොන්ක්‍රීට්වල තාප ප්‍රසාරණය වෙනස් වීම, කොන්ත්‍රාත්කරුගේ ඉදිකිරීම් දෝෂ හේතුවෙන් බොල්වීම් හා ඉරිතැලීම් සිදුව ඇති අතර අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. | ඉදිකිරීම් අඩුපාඩු අවම වන පරිදි ප්‍රමිතිගතව සිදුකල යුතුය. |

**1.5.7. ශීර්ෂය 213 - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**1.5.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව හා අනුකූල නොවීම | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008 (vi) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුකූල නොවන පරිදි අනුයුක්ත නිල වාහන හිමිකම් ඇති නිලධාරීන්ට හිමි මාසිකව හිමි ඉන්ධන ලීටර් 135 සීමාව ඉක්මවා විශ්‍රාමික පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ප්‍රධාන ලේකම්ගේ අනුමැතියක් නොමැතිව රු.1,628,735ක ඉන්ධන ලීටර් 4243 ක් ඉකුත් වර්ෂයේ දී සංචිත වාහන 03 ක් සඳහා ලබාගෙන තිබුණි. | 2023.04.01 දින සිට උක්ත චක්‍රලේඛයට අනුව ක්‍රියාත්මක වන බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 පෙබරවාරි 25 දිනැති අංක 05/2019 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව 2020 වර්ෂයේ සිට පහ ශ්‍රේණි ශිෂ්‍යාධාර මුදල් ශිෂ්‍යත්වලාභීන් හඳුනා ගෙන ගෙවීමකින් තොරව අවස්ථා 168 කට අදාළව කලාප කාර්යාල 04 ක රු.2,612,744 ක් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ගිණුම් අංක නිවැරදි නොවූ ශිෂ්‍යාධාර තොරතුරු නිවැරදි කර එවන ලෙස පාසල් වෙත ලිපි යොමු කර ඇත. | ශිෂ්‍යාධාර මුදල් ගෙවිය යුතු ශිෂ්‍යත්වලාභීන් නිවැරදිව හඳුනාගෙන එම ගෙවීම් අදාල ශිෂ්‍යයින් හට ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පළාත් මූල්‍ය රීති 54.4 ප්‍රකාරව 2020 ජනවාරි 03 දින දෙපාර්තමේන්තුවේ අවසරයකින් තොරව රියදුරු විසින් පදවාගෙන ගොස් දඹුලු පාරෙහි සමන්පුර ප්‍රදේශයේ දී අනතුරකට ලක්වී තිබුණු වෑන් රථය නැවත සකස් කිරීමට පළාත් සභාවෙහි ප්‍රතිපාදන රු.1,436,000 වැය කර තිබුණි. උක්ත වාහනය පූර්ණ රක්ෂණය සිදු කර තිබුණද, රියදුරුගේ බීමත්කම යන කාරණාව තුළ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ප්‍රතිපූර්ණ කර තිබුණේ රු.403,650 ක මුදලක් පමණි. ඒ අනුව මේ සම්බන්ධයෙන් 2024 අප්‍රේල් 10 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | මෙම රියදුරු වැඩ තහනම්ව සිටි කාල සීමාවට අදාල හිඟ වැටුප් නොගෙවීමට යටත්ව වහාම ක්‍රියාත්මක වන පරිදී විනය නියෝග වලට යටත්ව නැවත සේවයේ පිහිටුවා ඇති අතර එහිදී වෑන් රථයට සිදු වූ මුළු අලාභයෙන් රක්ෂණ සමාගම විසින් ප්‍රතිපූර්ණය කරන ලද රු. 403,650 ක මුදල අඩු කළ විට ලැබෙන ඉතිරි මුදල වන රු.1,391,350 ක අලාභය වහාම අප දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලෙස දන්වා ඇත. | පළාත් මූල්‍ය රීති අනුව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 අප්‍රේල් 09 දිනැති අංක 03/ 2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සියලුම රාජ්‍ය සේවකයින් තම සේවා ස්ථානයට පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මඟින් සනාථ කළ යුතු වුවත්, කිසිදු පාසලක් ඒපරිදි කටයුතු කර නොතිබුණි. | කිසිදු පාසලක ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම සිදු නොවන බව දන්වා ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.7.2 ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශේෂ අධ්‍යාපන ළමුන්ගේ තෙරපි කටයුතු සඳහා භාවිතයට ගැනීම් සඳහා එකක් රු.12,900 ක් වූ (VAT රහිත) Gymball 100 ක් රු.1,290,000 ක් ගෙවා මිලදීගෙන තිබුණි. නමුත් නිශ්චිත පිරිවිතර ඉදිරිපත් නොකර මිල ගණන් කැඳවා රු.2,400 ක අවම මිල ගණන් යටතේ ඉදිරිපත් කළ ආයතනය ප්‍රතික්ෂේප කිරීමට පෙර අවම මිල ඉදිරිපත් කළ ආයතනය තුළින් ලංසු ඇගයීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන තොරතුරු ගෙන්වාගෙන ඇගයීම සිදු කිරීම කටයුතු නොකිරීම තුළ රු.1,050,000 ක අලාභයක් සිදුවී තිබුණි. | ආයතනය දෙක ඉදිරිපත් කර ඇති ලංසුපත් අතර අවම මිලගණන් ඒවා ඇති (ට්‍රැම්පොලින් උපකරණ) ආයතනය වෙත අදාල උපකරණය පිළිබඳ පැහැදිලි විස්තර හා උපකරණයේ පින්තූර ලබා දෙන ලෙස දැනුම් දෙන ලදී. දුරකථන ඇමතුම් හා Email පණිවිඩ මඟින් දැනුම් දුන් නමුත් ඒ සඳහා ප්‍රතිචාර ලැබී නොතිබුණු බව දන්වා ඇත. | ප්‍රසම්පාදන අරමුණු වලට අනුකූලවන පරිදි කටයුතු කළ යුතුයි. රජයට සිදු වූ පාඩුව අදාළ නිලධාරීන්ගෙන් අය කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.7.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සතු ඉඩම් ඒකක 1215 න් ඒකක 61 ක් පමණක් රු.933,625,750 කට තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කර ඇතත්, ඉතිරි ඉඩම් ඒකක 1,154 අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් රු.44,968,590,125 කට තක්සේරු කර ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව ඉඩම් ඒකක 1,154 විධිමත් තක්සේරුවක් නොමැතිව ගිණුම්ගත කිරීමට කටයුතු කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | වටිනාකම නිවැරදිව තක්සේරු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් කලාප කාර්යාල 03 කට අයත් වූ පාසල් 364 ක එම භූමියෙහි/ ඉඩමෙහි අයිතිය තහවුරු කර ගැනීමට 2024 පෙබරවාරි 20 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ඉඩම් අයිතිය තහවුරු කරගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | ඉඩම්හි අයිතිය තහවුරු කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 2015 අප්‍රේල් 22 දින පැවති හයවන පළාත් සභාවේ පළමුවන අමාත්‍යාංශ මණ්ඩල තීරණ අංක 61/ අමා/ 2015/ 30 දරන තීරණය ප්‍රකාරව වයඹ පළාතේ පාසල්වල විදුහල්පති ශ්‍රේණිධාරීන්ගේ ස්ථාන මාරු පටිපාටිය ක්‍රියත්මක කරනු ලබන අතර, ඒ අනුව එකම පාසලක වසර 5 කට වැඩි විදුහල්පති සේවා කාලයක් සහිත විදුහල්පතිවරු ස්ථානමාරු කළ යුතු වුවද, වයඹ පළාතේ විදුහල්පති ස්ථානමාරු ප්‍රතිපත්තිය විධිමත්ව ක්‍රියාත්මක නොවීම තුල කුරුණෑගල කලාපයේ පමණක් වර්ෂ 05 ත් 14 ත් අතර කාලයක් එකම පාසලේ සේවය කරනු ලබන විදුහල්පතිවරුන් 72 දෙදෙනෙකු විය. | එම විදුහල්පති වරුන්ගේ ස්ථානමාරුවීම් 2024.06.03 දින ක්‍රියාත්මක කිරීමට නියමිතය. එහිදී කුරුණෑගල කලාපයේ වසර 05 ත් 14 ත් අතර කාලයක් එකම පාසලේ සේවය කළ විදුහල්පතිවරුන් සඳහාද ස්ථානමාරු වීම් ලබා දීමට කටයුතු යොදා ඇත. | 2015 අප්‍රේල් 22 දින පැවති හයවන පළාත් සභාවේ පළමුවන අමාත්‍යාංශ මණ්ඩල තීරණ අංක 61/ අමා/ 2015/ 30 දරන තීරණය ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ඈ) | ද්විතියික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන යටතේ ඉලක්කගත විෂයයන් සංවර්ධනය සඳහා පාසල් පාදක ප්‍රදානයන් ලබාදීම යටතේ කුරුණෑගල කලාප කාර්යාලය සඳහා රු.7,425,000 ක් ලබා දී තිබුණි. නියැදි පරීක්ෂණයට ලක් වූ විද්‍යාල 05 සඳහා වෙන්කළ රු.2,700,000 ක මුදලින් රු.1,870,380 ක මුදලක් විගණිත දිනය වූ 2023 ජූලි 10 වන විටත් ගිණුමෙහි නිශ්කාර්යව ඉතිරි වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය මගින් ලබා දුන් මුදල් වියදම් කර නොමැති නම් වහාම එම මුදල් වියදම් දරා අවසන් කරන ලෙස 2023 අගෝස්තු 09 දිනැති ලිපිය මගින් විදුහල්පතිවරුන් දැනුවත් කර ඇත. | ලැබෙන ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ද්විතියික අධ්‍යාපන ආංශික වැඩිදියුණු කිරීමේ වැඩසටහන (SESIP) යටතේ පාසල් නවෝත්පාදන විද්‍යාගාර පිහිටුවීම හා ක්‍රියාත්මක කිරීම සඳහා 2021 වර්ෂයේ රු.52,000,000 ක මුදලක් වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර, එම ප්‍රතිපාදන එක් පාසලක් සඳහා රු.800,000 බැගින් පාසල් 65 ක් සඳහා බෙදා දී තිබුණද එම ප්‍රතිපාදන වියදම් කළ ආකාරය හෝ එම වැඩසටහනෙහි භෞතික ප්‍රගතිය පිළිබඳ කිසිදු පසු විපරමක් සිදුකර නොතිබුණි. | පළාත් පාසල් 65 න් ස්ථිර උපකරණ මිලදී ගැනීම සඳහා වෙන්කර ඇති රු.32,500,000 න් රු.25,687,434.14 මුදලක් 2023 දෙසැම්බර් 31 දින දක්වා වැය දරා ඇති අතර රු.6,812,565 ක ප්‍රතිපාදන ඉතිරි වී ඇත. මෙම මුදල් වියදම් කල යුතු අවසන් දිනය 2024 දෙසැම්බර් 31 ලෙස දීර්ඝ කර ඇත. පළාත් පාසල් 65 න් ක්ෂය ද්‍රව්‍ය සඳහා වෙන්කර ඇති රු.19,500,000 න් රු.4,555,494 | ව්‍යාපෘතියේ අරමුණු ඉටුවන අයුරින් අරමුදල් භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| එමෙන්ම වයඹ පළාතෙහි කුරුණෑගල කලාපයෙහි විගණන පරීක්ෂාවට ලක් වූ පාසල් 05 හි උක්ත ව්‍යාපෘතිය ලබා දී තිබූ රු.4,000,000 ක ප්‍රතිපාදන වලින් රු.2,325,923 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | මුදලක් වැය දරා ඇති අතර රු.14,944,506 ක ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | |

**1.5.8. ශීර්ෂය 220 - වයඹ පළාත් සමූපකාර සංවර්ධන හා වෙළඳ, ඉඩම්, විදුලිබල හා බල ශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතුසංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යාංශය**

**1.5.8.1 ප්‍රමාද වූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ වයඹ පළාත් තුල ප්‍රතිලාභීන් සඳහා සූර්යබල විදුලිකෝෂ කට්ටල සැපයීම හා ස්ථාපනය කිරීම වෙනුවෙන් ගිවිසුම්ගත වූ රු.8,750,186 ක වටිනාකමැති ගිවිසුම ප්‍රකාරව 2023 දෙසැම්බර් 11 දින වැඩ නිමකල යුතු වුවත් එදින සිට සිව් වතාවක් සිදුකරන ලද දින දීර්ඝ කිරීම් වලට අනුව 2024 මාර්තු 31 දින තෙක් දින දීර්ඝ කර පැවති නමුත් විගණිත දිනය වන 2024 අප්‍රේල් 02 දින වන විටත් මෙම ව්‍යාපෘතිය අවසන් කර භාරදීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතියේ සූර්යබල උපාංග ස්ථාපනය රටේ පවතින ආනයන සීමාවන් නිසා ප්‍රමාද වූ අතර විදුලි උපාංග මෙරටට ගෙන්වා ස්ථාපනය කිරීමේදී අධීක්ෂණ කටයුතු ප්‍රමාද දෝෂයකින් ප්‍රාදේශීය ඉංජිනේරු - පුත්තලම වෙත පවරන ලද අතර පසුව එම සූර්යබල විදුලි යෝජනා ක්‍රියාත්මක කිරීමට නියමිත අදාල ප්‍රාදේශීය ඉංජිනේරු කොට්ඨාශවල ඉංජිනේරු හා තාක්ෂණික නිලධාරීන් අධීක්ෂණ කටයුතු සිදුකරනු ලබන අතර මෙම ව්‍යාපෘති සඳහා සම්බන්ධිත ආයතන ගණනාවක් පවතින බැවින් කාල පරාසය ප්‍රමාණවත් නොවීම මත නැවත ගිවිසුම්ගත කාලය දීර්ඝ කරගෙන ඇති අතර හැකි ඉක්මනින් මෙම ව්‍යාපෘති කටයුතු නිම කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | අනවශ්‍ය ආකාරයෙන් දින දීර්ඝ කිරීම් සිදුනොකර කඩිනමින් ව්‍යාපෘතිය නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.5.9. ශීර්ෂය 221 - සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

**1.5.9.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව හා අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1972 අංක 05 දරන සමූපකාර සමිති පනත හා 1973 සමූපකාර රීති 43 (I) හා 43(ii) ප්‍රකාරව වගන්තිය සමූපකාර සහකාර කොමසාරිස් කොට්ඨාශ 04 කට | 2024 මාර්තු 31 දින වන විට තවදුරටත් අයවිය යුතු හිඟ අරමුදල් දායකයේ ශේෂය රු.79,335,136 ක් බව දන්වා ඇත. | 1972 අංක 05 දරන සමූපකාර සමිති පනතේ 43 (I) වගන්තිය හා 1973 |

| | | | |
|---|---|---|---|
| | අයත් ලියාපදිංචි සමිති 677 ක් වෙතින් සමුපකාර අරමුදලට හිඟ දායක මුදල වූ රු.113,462,281 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | සමුපකාර රීති 43 (II) වගන්ති ප්‍රකාරව අරමුදල වෙත අයවිය යුතු හිඟ මුදල් නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත හා 1973 සමුපකාර රීති xi වන පරිච්ඡේදයේ 58 හා 59 වැනි වගන්ති හා රීති 49 (v) (ඇ) වගන්තිය ප්‍රකාරව මහව සහ කුලියාපිටිය සහකාර කොමසාරිස් කාර්යාලයන්ට අදාලව පිළිවෙලින් ලිපිගොනු 287 ක් හා 93 ක්ද ණය හා විවිධ ආරවුල්වලට අදාල රු.50,078,991 ක් වටිනා මුළු ලිපිගොනු 380 ක් මාස 01 සිට මාස 31 දක්වා කාල පමාවක් ගතව පැවතියද තීන්දුලබාදී නොතිබුණි. | නිරීක්ෂණයට අදාළව පිළිතුරු ලබා දී නොමැත. | සමුපකාර සමිති පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.9.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ---------------------------------------- | ------------ |
| (අ) | වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමුපකාර සහකාර කොමසාරිස් කොට්ඨාශ 04 පිහිටි සමුපකාර සමිති 61 ක වගකිවයුතු නිලධාරීන් 149 දෙනෙකුගෙන් රු.88,381,074 ක මුදල් වංචා, මුදල් අඩුවීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාර්තා වී තිබුණද ඊට අදාල විමර්ශනයන් සිදුකිරීම දුර්වල මට්ටමක පැවතුණි. | මහවින් රු.3,742,548 ක්ද, කුලියාපිටියෙන් රු.9,775,490 ක්ද අය වී ඇති බව දන්වා ඇත. | විමර්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර අයවීමට ඇති මුදල් අයකර ගත යුතුය.. |
| (ආ) | 1973 සමුපකාර සමිති රීති මාලාවේ 49 (V) (ඇ) වගන්තිය ප්‍රකාරව යම් බේරුම්කරුවකුට බේරුම් කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකල නොහැකි විම මත තමා වෙත යොමුකල ලියවිලි වහාම රේජිස්ට්‍රාර්වරයා වෙත ආපසු භාර දිය යුතු වුවත් මහව හා කුලියාපිටිය සහකාර කොමසාරිස් කොට්ඨාශ දෙකට අයත් සමිති 04 කට අදාල වටිනාකම රු.4,233,588 ක් වූ ලිපිගොනු 18 ක් මාස 06 ත් මාස 13 ත් අතර කාලයක් අත රඳවාගෙන කිසිදු තීරක තීන්දුවක් ලබාදිමකින් තොරව නැවත භාරදී තිබුණි. | තීරක ආරවුල් ගොනු තීරකකරණය සඳහා පත්කිරීම් සිදු කරන ලද නිලධාරීන් විසින් ඔවුන්ගේ රාජකාරි කටයුතු සහ පෞද්ගලික අපහසුතා නිසා විසඳීමෙන් තොරව ආපසු භාරදී ඇති අතර එම නිලධාරීන් වෙත මෙම තීරක ගොනුවලට අමතරව තීරක ගොනු භාර දී නොමැත. | සමුපකාර රීති මාලාව ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.5.10 ශීර්ෂය -222 ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

### 1.5.10.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් විගණනයට ඉදිරිපත් කරන ලද 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තාව අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන හා පුද්ගලයින් 55 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟහිටි දීර්ඝකාලීන බදු වටිනාකම රු.107,864,841 ක් විය | සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු ශේෂය නිවැරදි බව දක්වා තිබුණි. | අයවිය යුතු හිඟ බදු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.10.2 වෙනත් රාජ්‍ය ආයතන වලට ලබාදුන් සම්පත්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කුරුණෑගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් අංක 839 නගර මධ්‍ය ග්‍රාම නිලධාරි වසමේ මල්කඩුවාව ගමේ මු.පි.කු 736 දරන පිඹුරු කැලි අංක 01 වන ප්‍රමාණයෙන් අක්කර 01 යි පර්චස් 4.3 ක් වන ඉඩම කොටසක් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2014 දෙසැම්බර් 30 දිනැති අංක 4/10/22512 දරන ලිපිය මඟින් වර්ෂ 30 ක් සඳහා කුරුණෑගල පෞද්ගලික අධ්‍යාපන ආයතනය වෙත දිර්ඝ කාලීන බදු ලබා තිබුණ අතර මෙම ඉඩම වී අලෙවි මණ්ඩලයේ ව්‍යාපාර කාර්යයන් සඳහා මුල් කාලීනව අත්පත් කරගෙන තිබුණි. බදු අයකර ගැනීමේ හා බදු ගිවිසුම් අනුව කටයුතු කිරීමේදී ඇති වූ ගැටලුකාරී තත්වයන් මත මෙම ඉඩම නැවත වී අලෙවි මණ්ඩලය වෙත භාරදෙන ලෙස අධිකරණ තින්දුවක් මඟින් ප්‍රකාශයට පත්කර ඇතත් පුද්ගලික ආයතනය විසින් ඉඩමේ භුක්තිය ප්‍රාදේශිය ලේකම්වරයා වෙත භාර දී නොතිබුණ අතර බදු ලබාදිමේදී පදනම් කර ගන්නා ලද වාණිජ කටයුත්ත වාර්තමානය වන විට අදාළ ඉඩම් කොටසේ ක්‍රියාත්මක නොවුන අතර ඉඩමේ භුක්තිය බදු ගැනුම්කාර පාර්ශවය විසින් තබාගෙන තිබුණි.අදාළ ඉඩම දිර්ඝකාලින බදු ලබාදුන් දින සිට බදු මුදල් | ඉඩම් භුක්තිය භාර ගැනීම සම්බන්ධව නිතිමය ගැටළුවක් පවතින අතර මහාධිකරණ නඩුවේ පවතින නඩු තීන්දු ප්‍රකාරව ඉදිරි කටයුතු සිදුකරන බව දන්වා ඇත. | නීතිමය ගැටලු විසඳා ගැනිමෙන් පසු ගිවිසුම්ගත වී හිඟ බදු මුදල් ද අයකරගැනීමට කටයුතු කළ යුතු වීම. |

හා ඒ මත පොළී වශයෙන් රු.4,800,000 ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණි.

**1.5.10.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කුසල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පිහිටි අක්කර 100 ක රජයේ ඉඩමක් පුද්ගලික සමාගමකට දීර්ඝකාලීන බදු ගිවිසුමකින් බදු දුන් අතර, 1997 වර්ෂයේ සිට බදු ගෙවීම පැහැර හැර ඇති බැවින් රජයේ ඉඩම් ආඥා පනතේ 87 වගන්තිය යටතේ 2004 ජනවාරි 26 දින බදුකරය අවලංගු කර තිබූ අතර, 2013 මැයි 30 දින තෙක් අයවිය යුතු හිඟ බදු සහ දඩ පොලී රු. 36,587,033 ක් ලෙස ගණනය කර තිබූ අතර, එම මුදල සමාලෝචිත වර්ෂය තුළදී අයකරගෙන නොතිබුණි. | සමාගමට අදාළ පුද්ගලයින් මේ වන තෙක් සොයාගත නොහැකිව ඇති බවත්, අදාළ බදු මුදල් අයකර ගැනීමට කොළඹ දිසා අධිකරණයේ නඩුවක් පවරා ඇති බවත් දන්වා ඇත. | කඩිනමින් හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු අතර, බදු ගෙවීම් පැහැර හරින්නේනම් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම මඟින් හෝ හිඟ බදු සහ ඊට අදාල දඩ පොලී අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මනතිව් ග්‍රාම නිලධාරී වසමට අයත් අක්කර 29 පර්චස් 10 ක පමණ රජයේ ඉඩම 1988 ජූනි 29 දින සිට වසර 30 ක කාලයක් පුද්ගලික සමාගමක් වෙත දිගුකාලීනව බදුදී තිබුණි. එම පුද්ගලික සමාගමට ලබාදුන් ඉඩම එම සමාගම විසින් පළාත් ඉඩම් කොමසාරිස්ගේ අනුමැතියකින් තොරව 2008 ජූනි 11 දින වෙනත් පුද්ගලික සමාගමකට විකුණා තිබුණි. | 2014 ජනවාරි 08 දින පුත්තලම ප්‍රාදේශීය ලේකම් සිදු කරන ලද දැනුම්දීම මත නීත්‍යානුකූල නොවන පදනමින් ඉඩම අන්සතු කිරීමත් නිසිපරිදි බදු මුදල් නොගෙවීමත් මත බදු ගිවිසුම අවලංගු කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ 2014 ජනවාරි 29 දිනැතිව පුද්ගල සමාගම මඟින් සිදු කරන ලද ඉල්ලීම ද පදනම් කරගෙන ආරවුල් සහගත තත්වය විසඳමට අවශ්‍ය පියවර ගැනීමට ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇති බවත්, 2023 අප්‍රේල් 17 දින ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් පුද්ගලික සමාගම වෙත ලබා දී ඇති බදු අවලංගු කිරීමේ නියෝගය අත්හිටුවන ලෙස දන්වා ඇති බවත්, ඉන්පසුව විවිධ අවස්ථාවලදී පැවති ආරවුල් තත්වය සහ අදාළ පාර්ශවකරුවන්ගේ ඉල්ලීම් ද සලකා ඉඩම කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කර ඇති බවත් විගණනයට දැනුම් දී ඇත. | අදාළ සමාගම විසින් අනුමැතියකින් තොරව අදාල ඉඩම පෞද්ගලික සමාගමට විකුණා ඇතිනම්, එම සමාගමට විරුද්ධව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මනතිව් ග්‍රාම නිලධාරී වසමට අයත් හෙක්ටයාර 20.234 ක පමණ රජයේ ඉඩම 1993 පෙබරවාරි 24 දින වර්ෂ 30 ක කාලයක් පුද්ගලික සමාගමක් වෙත දිගුකාලීනව බදුදී තිබුණි. ඒ අනුව 2021 මැයි 28 දිනට අයවිය යුතු හිඟ බදු මුදල රු.1,753,228 ක් විය. එසේම මෙම බදු ගිවිසුමට අනුව එය 2023 පෙබරවාරි 24 දින අවසන් වූ අතර, එදින දක්වා සමාගමෙන් අයවිය යුතු මුළු හිඟ බදු සහ දඩ මුදල රු.505,602 ක් වන බවත්, එය අයකර ගැනීමට පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තවදුරටත් අයවිය යුතු හිඟ මුදල රු.305,127 ක් බව දන්වා ඇත. | අදාළ පුද්ගලික සමාගමෙන් අයවිය යුතු ඉතිරි හිඟ බදු මුදල් හා දඩ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.11 ශීර්ෂය 230 - වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යාංශය**

**1.5.11.1 මෙහෙයුම්අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන චක්‍රලේඛය අනුව රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින්ම ලියාපදිංචි කර තිබීම අවධාරණය කර ඇතත් සෞඛ්‍ය අමාත්‍යාංශය සතු රු.70,200,000 ක් වූ වාහන 07 ක ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට කටයුතු කොට නොතිබුණි. | වයඹ ප්‍රධාන ලේකම් සතු වාහන 06 ක ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකෙරෙමින් පවතින අතර අංක KR-3391 දරන ප්‍රාඩෝ රථයේ ලියාපදිංචි අයිතිය වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව පවතී. එකී රථයේ ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා ඇති අතර මේ සම්බන්ධ ඉදිරි කටයුතු ද සිදුකෙරෙමින් පවතින බව දන්වා ඇත. | වාහන වල ලියාපදිංචි අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.12 ශීර්ෂය 231 - සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

**1.5.12.1 අරමුණු වලින් බැහැර ක්‍රියාකාරකම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 වර්ෂය සඳහා වයඹ පළාත් සභාවට ප්‍රාථමික සෞඛ්‍ය සේවා සවිබල | පළාත් සෞඛ්‍ය සේවා සංකීර්ණයට අදාල පිවිසුම් මාර්ගය ඉදිකිරීමට | ව්‍යාපෘති ඵලදායි ලෙස අරමුණු ඉටුවන |

| | | | |
|---|---|---|---|
| | ගැන්වීමේ ව්‍යාපෘතිය සඳහා වෙන්කර තිබූ රු.1,511,398,023 ක මුදලින් රු.මිලියන 20 ක ඇස්තමේන්තු මුදලක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට පිවිසුම් මාර්ගයට ඉදිකිරීම සඳහා අනුමත කර රු.14,355,803 ක මුදලකට කොන්ත්‍රාත්කරු සමඟ 2023 ඔක්තෝබර් 12 වන දින ගිවිසුම්ගත වී තිබුණි. PSSP ව්‍යාපෘතිය මඟින්ම ඉටුකළ යුතු අත්‍යවශ්‍ය කාර්යයන් ඉටු නොකර ව්‍යාපෘතියේ අරමුණට අදාළ නොවන හා අත්‍යවශ්‍ය නොවන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ පිවිසුම් මාර්ගය ඉදිකිරීමේ කාර්යය සඳහා ප්‍රතිපාදන යෙදවීමට කටයුතු කර තිබුණි. | අදාලව පැරණි මුරකුටිය එහි සේවයේ නිරත ආරක්ෂක නිලධාරීන්ගේ මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට පහසුවන පරිදි මානව සම්පත් අධිකාරියේ ඉල්ලීම් සලසා බැලීමෙන් පසු සැලසුම්කර නව ඉදිකිරීම් සිදුකර ඇත. පැරණි මාර්ගය පටුවීම හා දෛනික අවශ්‍යතාවලදී සිදුවන නිරන්තර බාධා ඉවත් කිරීමට නව මාර්ගය සැලසුම්කර ඇත | ආකාරයට ආර්ථිකමය, කාර්යක්ෂමව, අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාගැනීමට හැකිවන ආකාරයට ඉටුකළ යුතු වීම. |
| (ආ) | PSSP (ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය) වැඩසටහනෙහි මූලික අරමුණු හා වියදම් සම්බන්ධ දර්ශක DLI නිවැරදිව අර්ථකථනය කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය තුළ රු.28,252,376 ක වටිනාකමකින් යුත් මූලික අරමුණට අනුකූල නොවන පරිදි ඉදිකිරීම් 05 ක් හා කාර්යාල උපකරණ මිලදී ගැනීම් අවස්ථා 03 ක් විය. | PSSP වැඩවිෂයයන් හා මිලදී ගැනීම් සඳහා වාර්ෂික සැලසුම් ඉදිරිපත් කර ව්‍යාපෘති අධ්‍යක්ෂගේ අනුමැතිය ලද පසු ඉටුකරනු ලැබේ. ඒ අනුව ව්‍යාපෘතිය යටතේ ඉටුකර ඇති සියළුම වැඩ විෂයයන් ඍජුවම ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතිය සවිබල ගැන්වීමේ ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම උදෙසා සිදුකර ඇති බව දන්වා ඇත.. | ව්‍යාපෘති ඵලදායි ලෙස අරමුණු ඉටුවන ආකාරයට ඉටුකළ යුතු වීම |

**1.5.12.2 අපේක්ෂිත නිමවුම් (out put) ලබා නොගැනීම**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ------------------------- | -------------------------------------- | ------------ |
| රෝහල් සෞඛ්‍ය තොරතුරු කළමනාකරණ (HHIMS) පද්ධතිය රෝහලේ සෑම අංශයක්ම ආවරණය වන පරිදි ස්ථාපිත කර යුතු වුවත් දඹදෙණිය, ගල්ගමුව, නිකවැරටිය රෝහල් වල ස්කෑන් ඒකකය, ශල්‍යාගාරය, රසායනාගාරය ඇතුළු සියලු ඒකක ආවරණය වන පරිදි එම පද්ධතිය ස්ථාපිත කර නොතිබීමෙන් එම HHIMS පද්ධතිය ස්ථාපිත කිරීමේ අරමුණ වන රෝගී සත්කාර සේවා ඉක්මනින් හා පහසුවෙන් සිදුකිරීමේ අරමුණ කෙරෙහි ලඟා වී නොතිබුණ අතර දඹදෙණිය, ගල්ගමුව හා නිකවැරටිය රෝහල් සඳහා ලබා දී තිබූ | විගණන විමසුම් සඳහා පිළිතුරු ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙතින් ලැබී නොමැති හෙයින් ඒ සඳහා කඩිනමින් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කරන බව දන්වා ඇත. | ව්‍යාපෘති ඉටුකිරීමේදී ආර්ථිකමය, කාර්යක්ෂම, ඵලදායි ආකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරා ගැනීමට හැකිවන ආකාරයට ඉටුකළ යුතුවීම හා නිශ්කාර්ය උපකරණ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |

ලැප්ටොප් පරිගණක 22 ක් කේත කියවන 20ක් මුද්‍රිත යන්ත්‍ර 02 ක් ස්ටිකර් ප්‍රින්ටර් 04 ක් හා ස්ටිකර් රෝල් 15 ක් නිශ්කාර්යව පැවතුණි.

**1.5.12.3 නිෂ්ක්‍රිය ඌන උපයෝජිත වත්කම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය, දඹදෙණිය මූලික රෝහල් 02 හි හා නාරම්මල ප්‍රාදේශීය රෝහලේ නේවාසික රෝගී වාට්ටු හා අනෙකුත් ඒකක වල අවශ්‍යතාවය වෙනුවෙන් ප්‍රමාණවත් ජීව වෛද්‍ය උපකරණ යොදවා තිබියදී 2017 වර්ෂයේ සිට 2022 වර්ෂයේ නොවැම්බර් දක්වා රෝහල් වෙත ලබාදෙන ලද 2023 වර්ෂයේ දළ වෙළඳපල වටිනාකම රු.10,109,760 ක් වූ ශල්‍ය උපකරණ වර්ග 15 ක ඒකක 101 ක් ශල්‍ය ගබඩා තුළ ගබඩා කර තිබුණි. | කොරෝනා වසංගත කාලය තුළ විවිධ ආයතන මඟින් පරිත්‍යාග වශයෙන් හා රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය මඟින් ජීව වෛද්‍ය උපකරණ බෙදාදීම තුළ අතිරික්ත උපකරණ රෝහල් තුළ පවතී. මෙමඟින් උපකරණ කිහිපයක් උපස්ථ උපකරණ ලෙස පවතින අතර අනිකුත් උපකරණ සියල්ල අවශ්‍යතා පවතින රෝහල් වෙත බෙදා දෙන ලෙස ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇති බවත් ඒ අනුව ඉදිරියේදී කටයුතු සිදුවන බවත් පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දන්වා ඇති බව දන්වා ඇත. | ශල්‍ය උපකරණ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු වීම. |
| **(ආ)** | කුරුණෑගල දිස්ත්‍රික්කයේ මූලික රෝහල් 04 හා නාරම්මල ප්‍රාදේශීය රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකකය, ECG ඒකකය, විශේෂ ළදරු සත්කාරක ඒකකය, X-RAY ඒකකය හා ශල්‍යාගාර යන ඒකක වල වසර 02 ක අධික කාලයක සිට අලුත්වැඩියා කර නොමැති වෛද්‍ය උපකරණ වර්ග 09 ක ඒකක 13 ක් නිෂ්කාර්යව පැවතුණි. | වෛද්‍ය උපකරණ අළුත්වැඩියා කිරීමට අවශ්‍ය අමතර කොටස් වෙළඳපොල තුල හිඟවීම හේතුවෙන් මෙම උපකරණ අළුත්වැඩියා නොකර පවතින අතර අමුද්‍රව්‍ය ලැබෙන ආකාරය අනුව කඩිනමින් අළුත්වැඩියා කටයුතු සිදුකරන බවට පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දන්වා ඇති බව දන්වා ඇත. | වෛද්‍ය උපකරණ ප්‍රමාදයකින් තොරව අලුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවර ගතයුතු වීම |
| **(ඇ)** | වෛද්‍ය සත්කාර ඒකකය හා නිල නිවාසය සඳහා රු.18,589,459 ක සමස්ථ වියදමක් දරා 2018 ඉදිකරන ලද සියඹලන්ගමුව ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයේ කටයුතු 2022 වර්ෂයේ මාර්තු 31 දින ආරම්භ කර තිබුණු අතර එහි සේවය කරන ලද ප්‍රධාන වෛද්‍ය නිලධාරි 2023 ජනවාරි 06 දින සිට පුහුණුවක් සඳහා එම ස්ථානයෙන් නිදහස් කිරීම නිසා එම දින සිට රෝගී සත්කාර සේවාවන් නවතා එම ඒකකය | ඉදිරියේදී රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලබාදෙන නව වෛද්‍ය නිලධාරියකු සියඹලන්ගමුව ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකය සඳහා අනුයුක් කිරීමට නියමිත බව දන්වා ඇත. | වෛද්‍ය නිලධාරියෙකු අනුයුක්ත කර ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයේ කටයුතු හැකි ඉක්මනින් ආරම්භ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නිශ්කාර්යව වසා දමා තිබුණි. | | |
| (ඈ) | PSSP ව්‍යාපෘතිය යටතේ මිලදීගත් රු.1,163,100 ක් වටිනා Emergency Trolley 04ක් හා Drugs Trolley 08 ක් 2024 මාර්තු දක්වා බෙදා නොදී මාස 14 ක කාලයක් මාරවිල රෝහල් ගබඩාවේ නිශ්කාර්යව පැවතුණි. | උපකරණ කඩිනමින් අවශ්‍යතා සොයා බලා ද්‍රව්‍ය බෙදා නොහැරීමට හේතු හා එම ද්‍රව්‍ය අවශ්‍යතා පවතින කුමන ආයතනය වෙත බෙදා හැර ලේඛනය විගණනය වෙත ඉදිරිපත් කරන බව දන්වා ඇත. | ගබඩාවල නිශ්කාර්යව පවතින උපකරණ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගතයුතුය. |

**1.5.12.4 ආර්ථික නොවූ ගණුදෙනු**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ---------------------------------- | ------------ |
| (අ) | 2021 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කළ බිහල්පොල සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය ඉදිකිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ රු 21,472,169 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම් ගතව 2023 නොවැම්බර් වන විට රු.16,196,304 ක වැඩ කොටස් නිමකර තිබූ අතර රු.6,060,918 ක මිල විචල්‍ය ගෙවීම් සමඟ එකතුව රු.22,257,222 ක් ගෙවා තිබූ හෙයින් මිල විචලනය කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 28 ක් විය. මෙම කොන්ත්‍රාත් ගිවිසුම අවලංගු කර කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්තුවෙන් ඉවත් වීම හේතුවෙන් ඉතිරි වැඩ සඳහා නැවත ලංසු කැඳවා පුද්ගලික ආයතනයක් සමඟ නව ගිවිසුමකට එළඹීමට සිදු වීමෙන් එම කාර්යය අවුරුදු 1 මාස 7 කාලයක් ප්‍රමාදව තිබූ අතර කළවැඩ සඳහා මූලික පිරිවැය රු.626,000 ක් නැවත දැරීමට සිදුවීමෙන් රජයට එම මුදලින් අලාභයක් සිදුව තිබූ අතර පළමු අවස්ථාවේ රු.3,282,270 ක් වූ ඉතිරි වැඩ සඳහා නව කොන්ත්‍රාත්කරු සමඟ රු.16,698,451 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම් ගතවීමට සිදුවීමෙන් රජයට රු.13,416,182 ක පාඩුවක් දැරීමට සිදුවී තිබුණි. | විගණන විමසුම් සඳහා පිළිතුරු ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් වෙතින් ලැබී නොමැති හෙයින් ඒ සඳහා කඩිනමින් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කරන බව දන්වා ඇත. | ව්‍යාපෘති ඉටුකිරීමේ ආර්ථිකමය කාර්යක්ෂමතාව හා ඵලදායි ආකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාගැනීමට හැකිවන ආකාරයට ඉටුකළ යුතු වීම. |
| (ආ) | 2019 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර ගිවිසුම් 03 ක් යටතේ ගොකරැල්ල දිස්ත්‍රික් රෝහලේ ප්‍රාථමික සත්කාර ඒකකය රු.155,911,068 ක කොන්ත්‍රාත් වටිනාකමක් යටතේ ආයතන 02 ක් සමඟ ගිවිසුම් ගතව 2023 ඔක්තෝබර් 10 වන විට රු.109,783,998 ක වැඩ කොටස් නිමකර තිබුණි. මේ අනුව ගිවිසුම අනුව වැඩ නිම | පිළිතුරු ලබා දී නොමැත. | ව්‍යාපෘති ඉටුකිරීම ආර්ථිකමය කාර්යක්ෂමතාව හා ඵලදායි ආකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාගැනීමට හැකිවන ආකාරයට ඉටුකළ යුතු වීම. |

නොකර දින දීර්ඝය අනුමත කර මිල විචලාතා සඳහා බිල්පත් ගෙවීම් ප්‍රමාදය සඳහා පොළී ගෙවීම් අනුමත කර තිබියදී කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත බිල්පත් ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් පලමු කොන්ත්‍රාත්කරු සමඟ පවතින ගිවිසුම අවලංගු කර නැවත තුන්වැනි වරටත් එම කොන්ත්‍රාත් ආයතනය සමඟ නව ගිවිසුම් වලට යාම හේතුවෙන් රජයට රු.21,606,021 ක අලාභයක් සිදුවී තිබුණි. ඊට අමතරව නව ගිවිසුම් වලට එළඹීමේදි ප්‍රාථමික පිරිවැය වශයෙන් රක්ෂණ, ලංසු සුරක්ෂණ, අත්තිකාරම් සුරක්ෂණ ආදී කාලීන ගිවිසුම් යටතේ දැරූ වියදම් නැවත දැරීමට සිදුවීමෙන් රජයට රු.1,616,500 කට ආසන්න අමතර පිරිවැයක් දැරීමට සිදුව තිබුණි.

**1.5.12.5 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නියමිත දෛනික සේවා කාලය තුළට ගැනෙන දිවා විවේකය සඳහා වූ විනාඩි 30 ක කාලයද ඇතුළත්ව මධ්‍යහන 12.00 සිට ප.ව 1.00 දක්වා වූ පැයක කාලය සඳහා 2022 හා 2023 වර්ෂ සඳහා අතිකාල දීමනා ලෙස කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත වෛද්‍යවරු 21 දෙනෙකු සඳහා රු.1,863,392ක්ද, පුත්තලම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත වෛද්‍යවරු 11 දෙනෙකු සඳහා රු. 1,241,141ක අතිකාල දීමනා ගෙවා තිබුණි. | මේ සම්බන්ධව වයඹ ප්‍රධාන ලේකම් සමග පළාත් විගණන කමිටුවේදී සාකච්ඡා කිරීමෙන් පසු රේඛීය හා පළාත් ආයතනවලට අදාලව ඒකීය ගෙවීම් ක්‍රමයක් යෝජනා කරන ලෙස පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වෙත උපදෙස් ලබාදී ඇති හෙයින් එම උපදෙස් ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. | ගෙවීම් කිරීමේදී නිතීරීති හා චක්‍රලේඛ වලට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008 (vi) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (අ) වගන්තිය අනුව අනුයුක්ත නිල වාහන හිමිකම් ඇති නිලධාරීන්ට හිමි මාසික ඉන්ධන ලීටර් 135 සීමාව ඉක්මවා පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතියක් නොමැතිව ඉන්ධන ලීටර් 4943.4 ක් සමාලෝචිත වර්ෂයේදී වාහන 02 ක් සඳහා ලබාදී තිබුණි. ඒ අනුව පූර්ව අනුමැතියකින් | අංක PJ – 4705 හා PG – 9401 දරණ කැබ් රථ පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සංචිත වාහන වන අතර, සංචිත වාහන සඳහා ඉන්ධන සීමාවන් නොමැති බැවින් ඉන්ධන සැපයීම සඳහා ප්‍රධාන ලේකම් වෙතින් අනුමැතියක් ලබාගෙන නොමැති බව දන්වා සිටිමි. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ, මධ්‍යම රජයේ | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | තොරව මාසික ඉන්ධන සීමාව ඉක්මවා 2020 ජනවාරි 01 සිට 2023 මාර්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුළ වටිනාකම රු.1,989,376 ක් වූ ඉන්ධන ලීටර් 4943.4 ක් ලබාගෙන තිබුණි. | රාජකාරීවලට යොදා ගන්නා වාහන සඳහා අමතර ඉන්ධන සැපයීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත එම රාජකාරී සඳහා පොළොන්නරුව මහ රෝහලෙන් ඉන්ධන සපයාගෙන ඇති බව දන්වා ඇත. | |
| (ඇ) | 2021 දෙසැම්බර් 29 දිනැති අංක 13/2008 (iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 (අ) වගන්තිය අනුව අනුයුක්ත නිල වාහන හිමිකම් ඇති නිලධාරීන්ට හිමි මාසික ඉන්ධන ලීටර් 135 සීමාව ඉක්මවා ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂ විසින් ප්‍රධාන ලේකම්ගේ පූර්ව අනුමැතියක් නොමැතිව ඉන්ධන ලීටර් 1,380 ක් සමාලෝචිත වර්ෂයේදී වාහනයක් සඳහා යොදාගෙන තිබුණි. ඒ අනුව පූර්ව අනුමැතියකින් තොරව මාසික ඉන්ධන සීමාව ඉක්මවා 2022 ජනවාරි 01 සිට 2023 මාර්තු 31 දක්වා කාල පරිච්ඡේදය තුළ ලබාගෙන තිබූ ඉන්ධන ලීටර් 1380 ක වටිනාකම රු.383,796 ක් විය. | ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්ගේ ක්ෂේත්‍ර අධීක්ෂණ රාජකාරී බහුලවීම හේතුවෙන් කිසිම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයක නිල වාහන වෙන්කර ගැනීමක් මේ දක්වා සිදුකර නොමැත. එබැවින් PI-0886 දරණ වාහනයට ඉන්ධන සැපයීම සංචිත වාහනයකට ඉන්ධන සැපයීමක් ලෙස සලකා කටයුතු බව දන්වා ඇත. | චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළයුතුය. |
| (ඈ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ දඹදෙණිය, ගල්ගමුව, පොල්ගහවෙල, මහව හා නිකවැරටිය යන රෝහල්වලට 2023 වර්ෂයට අමු ආහාර සපයනු ලබන විවිධ සේවා සමූපකාර වලට පළමු කාර්තුවේ අමු ආහාර සඳහා ගෙවීම් කිරීමේදී තීරණය කළ මිලට වඩා අඩු අගයක් එම සමිති ඉදිරිපත් කර තිබියදී එම මිල නොගෙවා තීරණයකල මිල ගෙවීම් කිරීම මගින් රු.758,239ක් රජයට අලාභ සිදු වි තිබුණි. | ලංසු ඇගයීම සඳහා පත්කරන ලද ලංසු ඇගයීමේ කමිටු ලබාදී ඇති නිර්දේශ මත මිල ගණන් තීරණය කර ඇත. | ප්‍රසම්පාදන නීතිරීති අනුව කටයුතු කළ යුතු වීම හා ප්‍රසම්පාදන තීරණ ගැනීමේදී රජයට අවාසිදායක නොවන ආකාරයට කටයුතු කළ යුතුය. |
| (ඉ) | දඹදෙණිය මූලික රෝහල සඳහා 2022 ජනවාරි 25 දින රු.1,974,000 ක වියදමක් දරා සවිකරන ලද ආරක්ෂිත කැමරා පද්ධතිය වගකීම් කාලය තුළදී ක්‍රියා විරහිත වී ඇතත්, ඒ සම්බන්ධව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ආරක්ෂිත කැමරා පද්ධතිය මේ වන විට නිසි ක්‍රියාකාරිත්වයේ පවතින බව දන්වා ඇත. | උපකරණ අලුත්වැඩියා කිරීමට කඩිනමින් පියවරගත යුතුය. |
| (ඊ) | කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් වාහන දෙකක්අනතුරුට ලක්වී පිළිවෙලින් වසර 3 ½ ක් හා වසර 02 මාස 03 ක් ගතවී තිබුණද මූලික පරීක්ෂණ අවසන් වී විනය පරීක්ෂණ අවසන් වී නොතිබීමෙන් එකතුව | LW-1790 ගිලන් රථය රියදුරුගේ වරදින් අනතුරට ලක්වී ඇති අතර එහි මුළු අලාභයවන රු.11,705,790 (දෙපාර්තමේන්තු ගාස්තු ද ඇතුලත්ව) රියදුරුගෙන් අයකිරීමට හා වරදකරු වූ රියදුරු | පළාත් මූල්‍ය රීති අනුව වින පරීක්ෂණ ප්‍රමාදයකින් තොරව පවත්වා ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.18,334,550 ක අලාභ අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර නොතිබුණි. | සේවයෙන් පහකිරීම සඳහා විනය නියෝග ලබාදී ඇති බව හා PE-4736 දරණ කැබ් රථය අනතුරට ලක්වීමට අදාලව කමිටුවක් මගින් පරීක්ෂණ කටයුතු සිදුවෙමින් පවතින බව දන්වා ඇත. | |
| (උ) | කුරුණෑගල RMSD මගින් සිදුකරනු ලබන දේශීයව මිලදී ගත් ඖෂධ වල ප්‍රමාණයන් හා වටිනාකම් Pronto පද්ධතියට ඇතුළත් නොකර RMSD මගින් පවත්වාගෙන යනු ලබන Medical Logistics information management system නැමැති පරිගණක පද්ධතියට පමණක් ඇතුළත් කිරීම හේතුවෙන් 2022 වර්ෂයේ ජනවාරි සිට 2023 ජුනි 30 දක්වා අවස්ථා 21 කදී එකතුව රු.3,732,685 ක් වැයකර දේශීයව මිලදී ගත් ඖෂධ වර්ග 18 ක් Pronto පද්ධතියෙන් අත්හැරී තිබුණි. | ඖෂධ මිලදී ගැනීම් කටයුතු සිදු කිරීමට ආයතන ලියාපදිංචි කිරීම , මිල ගණන් කැඳවීම, මිලදී ගැනීම් නියෝග පත්‍ර සැකසීම ආදී අවශ්‍ය කටයුතු සිදු කිරීම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල මගින් සිදු කරනු ලබන බැවින් ප්‍රාදේශීය මිලදී ගැනීම් තොරතුරු Pronto පරිගණක පද්ධතියට ඇතුලත් කිරීම සිදු නොවේ.මිලදීගත් ඖෂධ ප්‍රමාණය හා වටිනාකම Medical Logistics information management System පද්ධතියට ඇතුළත් කර පවත්වාගෙන යනු ලැබේ. | ප්‍රාදේශීයව මිලදී ගත් ඖෂධ සම්බන්ධයෙන් තොරතුරුද පවතින ඖෂධ සැපයුම් පද්ධතියට ඇතුළත් කළ යුතුය. |
| (ඌ) | කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල ඖෂධ අවශ්‍යතාවය වෙනුවෙන් ලබාදෙන ලද රු.12,679,248 වටිනාකමැති 2023 දෙසැම්බර් 31 දිනට තත්ත්වයෙන් අසමත් ඖෂධ තොග ප්‍රමාණයක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | තත්ත්වයෙන් අසමත් ඖෂධ අපහරණ සම්බන්ධ ක්‍රියාවලිය 2024 ජූලි මාසයෙන් පසු ආරම්භ කිරීමට නියමිත බව දන්වා ඇති බව දන්වා ඇත. | තත්ත්වයෙන් අසමත් ඖෂධ තොග ඉවත්කිරීමට කටයුතු කළ යුතුය |
| (එ) | ඖෂධ කළමනාකරන දුර්වලතා හේතුවෙන් කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කවල රෝහල්වල 2023 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු 538,048 ක්වූ කල් ඉකුත් වූ ඖෂධ තොග පැවති අතර ඒවා අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය මත රෝගීන් රෝහල්වලට පැමිණීමේ අඩුවක් පැවති බැවින් කල් ඉකුත්වීමට ආසන්න ඖෂධ වෙනත් රෝහල්වලට යොමු කිරීමටද නොහැකි වූ බවත්, මේ හේතුව නිසා අදාළ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය කල් ඉකුත්වී ඇති බව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දන්වා ඇත. | ඖෂධ කල් ඉකුත්වීමට පෙර අවශ්‍ය රෝහල් වෙත ලබාදීමට කටයුතු කළයුතු වීම හා කල්ඉකුත් වූ ඖෂධ අපහරණයට කටයුතු කළ යුතුය |

**1.5.13. ශීර්ෂය -234 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

**1.5.13.1. නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව හා අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.7 වගන්තිය අනුකූල නොවන පරිදි වයඹ පළාත් පරිවාස දෙපාර්තමේන්තුවේ සහ වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත්ව නොතිබියදී ගණකාධිකාරි තනතුරේ රාජකාරි ආවරණය සඳහා නිලධාරීන් පත්කර පිළිවෙලින් 2019 ජූලි සිට රු.630,579 ක්ද, 2013 අප්‍රේල් සිට රු.1,250,137 ක මුදලක්ද, දෙසැම්බර් 31 දිනට රාජකාරි ආවරණ දීමනා ලෙස ගෙවා තිබුණි. | පරිවාස දෙපාර්තමේන්තුව සඳහා ගණකාධිකාරී තනතුරක් අනුමත වී නොමැති බැවින් දෙපාර්තමේන්තුව මුහුණ දී ඇති ගැටළුව සඳහන් කරමින් කරන ලද ඉල්ලීම් ප්‍රකාරව තනතුරක් අනුමත වනතෙක් ගණකාධිකාරී වරයෙකුගේ සේවය ලබා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය, ලැබී ඇති බව හා ස්ථිර තනතුරක් ඇති කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති බව දන්වා ඇත. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටි රීති සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

**1.5.13.2. නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේදී පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.4,866,842 ක වියදමින් මීගලෑව අම්ල සෙවන ළමා නිවාස පරිශ්‍රයේ ඉදිකල අවිවාහක ගර්භණී මව්වරුන් සඳහා වූ රැකවරණ මධ්‍යස්ථානයේ කටයුතු එම නිවාසයේ ඉතිරි වැඩ හා නිවාසයේ තාප්පය හා ගේට්ටුව ඉදිකිරීම් කටයුතු ප්‍රමාදවීම හේතුවෙන් ප්‍රයෝජනයට නොගෙන නිශ්කාර්ය පැවතුණි. | මීගලෑව අම්ල සෙවන ළමා නිවාස පරිශ්‍රයේ ඉදිකරන ලද අවිවාහක ගර්භණී ළමා මවුවරුන් සඳහා රැකවරණ මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිමකිරීමට 2023 වර්ෂයේ පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව (ජාතික) විසින් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන බව දන්වා තිබූ හෙයින් එම වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ ඉදිකිරීමට ඇතුලත් නොකල නමුත්, පරිවාස හා ළමා රක්ෂක සේවා දෙපාර්තමේන්තුව (ජාතික) විසින් ප්‍රතිපාදන ලබා දීමට ප්‍රමාද වූ බැවින් වැඩ නිම කිරීමට නොහැකි වූ බවත් මෙම වසරේදී වැඩ නිම කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බවත් දන්වා ඇත. | ඉදිකිරීම් කටයුතු අවසන් කර ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.14. ශීර්ෂය 241 - පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

#### 1.5.14.1. කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හලාවත ඉංජිනේරු කාර්යාලයට අයත් වන පනන් ගොඩසාගරගම මාර්ගයේ පයිප්ප බෝක්කුව ඉදිකිරීම සඳහා රු.3,997,320 ක් වූ ඉංජිනේරු ඇස්තමේන්තුවට අදාලව ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලැබී තිබුණු ලංසු 05 ක් අතරින් සියයට 23.9 ක් සියයට 22 වශයෙන් ඇස්තමේන්තු මිලට අඩු මිල ලංසු ඉදිරිපත් ව තිබියදී සියයට 7.3 ක අඩු මිල ඉදිරිපත් කල තුන්වන අවම ලංසුකරුට ලංසු ප්‍රධානය කිරීම හේතුවෙන් රු.511,075 ක අවම අලාභයක් රජයට සිදුව තිබුණි. | ප්‍රසම්පාදන කමිටුව විසින් පොදුවේ සියලුම කොන්ත්‍රාත්වලට අදාළ වන පරිදි සැලකිය යුතු අඩුවීම සියයට 21 සීමාව දක්වා වන සේ සලකා ප්‍රසම්පාදන තීරණ ගෙන ඇති බව දන්වා ඇත. | ඉදිකිරීම ප්‍රමාණවත් කාලයක් යහපත් මට්ටමකින් පවතින පරිදි ප්‍රමිතිගතව හා පිරිවිතරයන්ට අනුකූලව නිමකල යුතු අතර ඒ සම්බන්ධ මනා අධීක්ෂණයක් සිදුකල යුතුය. |
| (ආ) | ආණමඩුව විධායක ඉංජිනේරු කාර්යාලය හා හලාවත මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් 2021 වර්ෂය ආශ්‍රිත කර්මාන්ත සඳහා ලබාගත් බොරළු, වැලි හා ABC සම්බන්ධ මිල ගණන් විශ්ලේෂණය කිරීමේදී ආණමඩුව විධායක ඉංජිනේරු කාර්යාලය විසින් වැඩි මිල ගණන් ගෙවීමට කටයුතු කිරීමෙන් රජයට රු.6,042,152 ක අලාභයක් සිදුව තිබුණි. | අදහස් දක්වා නොමැත. | ඍජු ශ්‍රම කර්මාන්ත සඳහා ඉදිකිරීම් ද්‍රව්‍ය සපයාගැනීම සඳහා මිල විශ්ලේෂණය කිරීමේදී අදාල නිශ්චිත ස්ථාන සඳහා නිවැරදි දුරට සහ දිස්ත්‍රික් මිල කමිටුවල මිල ආදියට අනුකූලව තාත්ත්වික මිල ගණන් භාවිතා කල යුතුය. |
| (ඇ) | ආණමඩුව විධායක ඉංජිනේරු කාර්යාලය සංවර්ධන වැඩ ඉටුකිරීමේදී 2021 පළමු භාගය සඳහා පුත්තලම් දිස්ත්‍රික් මිල කමිටු වාර්තාව අනුව අනුමත බොරළු කියුබ් 01 ක මිල රු.2,000 ක් (පැටවීම හා රාජ්‍ය භාග ඇතුළත්ව) වුවද, වයඹ පළාත් මිල කමිටුව දැක්වූ රු.3,000 ක ඉහළ මිල භාවිතා කර 2021 වර්ෂයේ බොරළු ඝන මීටර් 5,907 ක් හෙවත් කියුබ් 2,085 ක් මිලදී ගැනීමෙන් රු.2,085,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි. | පළාත් සභාවට අයත් ආයතනයක් ලෙස පළාත් මිල කමිටුව යොදාගන්නා අතර පුත්තලම හා කුරුණෑගල යන දිස්ත්‍රික් ලේකම්වරු දෙපලම එම මිල කමිටුවට ඇතුලත් බව දන්වා ඇත. | එකම නිලධාරීන් සහභාගී වන කමිටු දෙකකදී ලබාදී ඇති තීරණ වෙනස් වන්නේනම් ඒ සඳහා නිශ්චිත හේතු තීරණ සමඟ දැක්විය යුතුය. |

**1.5.15. ශීර්ෂය 244 - ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව**

**1.5.15.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පේෂකර්ම දෙපාර්තමේන්තුවේ ආදේශ මැහුම් උපදේශිකාවකට ස්ථිර මැහුම් උපදේශිකා තනතුරක් 2012 නොවැම්බර් 01 සිට ලබා දීමේදී මෙම නිලධාරිනිය ව්‍යාජ ප්‍රතිඵල ලේඛන ඉදිරිපත් කර ඇති බව තහවුරු වීම හේතුවෙන් වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් එම පත්වීම ශූන්‍ය හා බල රහිත කිරීමෙන් මෙම නිලධාරිනියට වර්ෂ 10 ක කාලයක් සඳහා ගෙවා තිබූ දළ වැටුප් රු. 3,639,584 මුදලක් 2023 දෙසැම්බර් 31 දින විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සහකාර ලේකම් මගින් මූලික විමර්ශනයක් පවත්වා නිලධාරිනියගේ පත්වීම ශූන්‍ය හා බල රහිත සේ සලකා අහෝසිකර ඇත. | නිලධාරිනිය බඳවා ගැනිමට පෙර ප්‍රතිඵල සනාථ කර ගැනීමට කටයුතු කළ යුතුය. ගෙවූ වැටුප් මුදල නිලධාරියගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.16. ශීර්ෂය 250 - වයඹ පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, ධීවර, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය**

**1.5.16.1** වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ඔක්තෝබර් 10 දින පළාත් සභාව විසුරුවා හැරීමට පෙර දේශපාලන අධිකාරිය වෙත වෙන්කර තිබූ ද්විත්ව කාර්යය කැබ් රථය 2014 දෙසැම්බර් 30 දින සිදුවූ අනතුරට අදාලව රු.6,019,533 ක අලාභයක් සිදුවී තිබූ අතර, ඉන් රු.3,960,000 ක මුදලක් රක්ෂණ සමාගම මගින් ප්‍රතිපූර්ණය කර තිබුණි. ඉතිරි රු.2,059,533 ක මුදල අදාල වගකිවයුතු පාර්ශවයන්ගෙන් 2023 අගෝස්තු 08 දින වන විටත් අයකරගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | වාහනයේ තව දුරටත් හිගව පවතින රු.2,059,533ක මුදල අය කිරීම සඳහා අදාල රියදුරුට විරුද්ධව හලාවත දිසා අධිකරණයේ නඩුවක් මේ වන විට විභාග වෙමින් පවතී. එසේම නව වැසි අංකය රජයේ කර්මාන්ත ශාලාව වෙත යොමු කර මුද්‍රණය කර ඇති අතර මෙය සංශෝධනය කර ගැනීමට ඇති හැකියාව පිලිබඳව රජයේ කර්මාන්ත ශාලාව වෙතින් විමසා ඉදිරි කටයුතු කරන බව දන්වා ඇත. | රාජ්‍ය දේපලවලට සිදුවූ හානි සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් හෝ නඩු පැවරීමක් සිදුකර අදාල පාර්ශවයන්ගෙන් හානියේ වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.16.2 කළමණාකරන අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංක 4/14/76 හා 2007 මැයි 09 දිනැති ලිපියට අනුව කිරි ගව අභිජනන මධ්‍යස්ථානයක් හා පුහුණු ගොවිපලක් ඇතිකිරීම සඳහා මාවතගම ඩෙනවර්වත්ත ඉඩමෙන් අක්කර 119 පර්වර්ස් 12 ක් 2007 මැයි 16 දින මාවතගම ප්‍රාදේශීය ලේකම් විසින් වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත භාරදී තිබූ අතර, එදින සිට අමාත්‍යාංශය වාණිජ අත්තිකාරම් ගිණුමක් හරහා අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට සැලසුම් සකස් කර ක්‍රියාත්මක කර තිබුණි. 2007 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා එක් එක් වර්ෂය වෙනුවෙන් වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2022 ජූලි 19 දින එම ඉඩමෙන් අක්කර 91 ක කොටසක් වසර 30 ක කාලයක් පරිහරණය කිරීම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අනුමැතියක් නොමැතිව අවබෝධතා ගිවිසුමක් මඟින් ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයට පරිහරණය සඳහා භාරදී තිබුණි. | 2007 මැයි 16 වන දින මාවතගම ඩෙනවර් වත්ත ඉඩමෙන් අක්කර 119 පර්චස් 12ක් මෙම අමාත්‍යාංශය වෙත පවරා දී ඇති අතර, මෙම ඉඩම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමේ අරමුණද ඉටු වන අයුරින් සත්ත්ව පාලන හා කෘෂිකාර්මික ගොවිපලක් ලෙස සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව සමග ගිවිසුම්ගතව ඇති අතර,අමාත්‍යාංශය වෙත ඉඩම සම්බන්ධ සම්පූර්ණ අයිතිය පවතී.එබැවින් මෙම ඉඩම නාවික හමුදාව වෙත පවරා දීමක් සිදු වී නොමැති බැවින් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොමැති බව දන්වා ඇත. | රජයේ ඉඩම් දිගුකාලීනව බදුදීමේදී ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. |

**1.5.17 ශීර්ෂය 251 - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**1.5.17.1 වාහන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාත් සභාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ භාවිතා කරන වාහන 03 ක් පෞද්ගලික නමින් ලියාපදිංචි කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ලියාපදිංචි අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.18 ශීර්ෂය 253 - වාරිමාර්ග දෙපාර්තමේන්තුව**

**1.5.18.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව හා අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 10 දිනැති අංක.3/2020 දරන පළාත් භාණ්ඩාගාර මුදල් චක්‍රලේඛය ප්‍රකාරව වයඹ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ගොවි සංවිධානයකට එකම අවස්ථාවේදී රු.5,401,331 ක් වූ කොන්ත්‍රාත් 05 ක් පිරිනමා තිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී එවැනි තත්ත්වයක් ඇති නොවීම සඳහා අභ්‍යන්තර ක්‍රමවේද ශක්තිමත් කර ඇති බව දන්වා ඇත. | කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේදී අදාල චක්‍රලේඛයට අනුකූලව සිදුකළ යුතුය. |

**1.5.19 ශීර්ෂය 260 - ප්‍රධාන ලේකම් කාර්යාලය**

**1.5.19.1 ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව පළාත් පාලන ආයතන 30 කට ගෙවිය යුතු උසාවි දඩ මුදල් රු. 275,288,113 ක් හා පළාත් පාලන ආයතන 22 කට ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.353,502,801 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පළාත් පාලන ආයතන වලට ලබාදීමට කටයුතු කර නොතිබුණි. | පළාත් පාලන ආයතන වලට ගෙවා නොමැති රු. 353,502,801 ක මුද්දර ගාස්තු මුදල 2023/12/31 වන තුරු ආපසු ලබා දෙන ලෙස පළාත් පාලන ආයතන විසින් ඉල්ලීම් කර නොමැත. 2024 මුල් කාර්තුව තුළ එම ආදායම් පළාත් පාලන ආයතන වලට ගෙවීමට නියමිතය. පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු උසාවි දඩ මුදල් ද 2023 දෙසැම්බර් මස වයඹ පළාත් සභාවට ලද ආදායම් වේ. මෙම ආදායම් 2024 මුල් කාර්තුව තුළ ගෙවීමට නියමිත බව දන්වා ඇත. | අදාළ ගාස්තු කඩිනමින් පළාත් පාලන ආයතන වෙත ලබා දීමට කටයුතු කළයුතුය |

**1.5.19.2. නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව හා අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | පොදුතැන්පත් ගිණුමේ රඳවාගෙන ඇති වසර ඉක්මවූ තැන්පත් ශේෂ 2 | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 571.2 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු 09 කට අදාළ ඉඩම් තැන්පත් හැර පොදු තැන්පතු අවුරුදු 02 කට වඩා වැඩි ශේෂය රු.42,160,591 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | |

**1.5.19.3 ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 මාර්තු 06 වන දින පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් විසින් වයඹ පළාත් ආණ්ඩුකාරවරයා වෙත යොමුකරන ලද ලිපියක් මඟින් වයඹ පළාත් සභාවට අයත් රාජ්‍ය ආයතනවල වහල සෙවිලි මතුපිට සූර්ය බල පද්ධති සවි කිරීම සඳහා පුද්ගලික සමාගමක් නම්කර තිබුණු අතර, එම ඉල්ලීමට අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5,3.10,3.11 මාර්ගෝපදේශය සහ 9 වන පරිච්ඡේදයට අනුකූල නොවන පරිදි අදාළ සමාගම වෙත සෘජු කොන්ත්‍රාත් ප්‍රදානයක් සිදු කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් කර තිබූ කැබිනට් පත්‍රිකාවට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබුණු බවට වයඹ ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක NWP/GOV/AD/02/15/2019 හා 2019.08.20 දිනැති ලිපිය මඟින් දන්වා ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක වූ බව දන්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |

**1.5.19.4 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගොස්තු 20 වන දින සිට 2023 සැප්තැම්බර් 30 දින දක්වා වයඹ පළාත් සභාවේ සූර්ය බල පද්ධති සවිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමට අදාළ පුද්ගලික සමාගම විසින් ප්‍රධාන ලේකම් වෙත ලැබිය යුතු එකතුව රු.1,841,347 ක බදු මුදල් අදාළ ආයතනය වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම බදු මුදල් කඩිනමින් ගෙවා අවසන් කරන ලෙසට දිගින් දිගටම අදාළ සමාගම වෙත දැනුවත් කර ඇත. | බදු මුදල් අය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දීර්ඝ කාලයක සිට වයඹ පළාත් සභාව තුළ ලංකා බැංකුවට සහ ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්යාලය වෙනුවෙන් ලබා දී ඇති ගොඩනැගිලි වලින් කුලි අදායම් පළාත් සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පළාත් සභා සංකීර්ණයේ ලංකා බැංකු ගොඩනැඟිල්ල සහ ජාතික රක්ෂණ භාර අරමුදලේ ගොඩනැඟිල්ල සඳහා තන්සේරු මුදලක් ලබා ගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර ඇති අතර, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අදාල ගොඩනැඟිලි තක්සේරු කර දීමෙන් අනතුරුව කුලී ආදායම් පළාත් සභාව වෙත ලබාගැනීමට කටයුතු කරනු ඇත. | ගොඩනැගිලි තක්සේරු කර ආදායම් අයකිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.19.5 නිශ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාත් සභාවේ ආයතන 13 ක වාහන 28 ක්, යතුරු පැදියක්, ත්‍රීරෝද රථයක් හා යන්ත්‍ර 05 ක් නිශ්කාර්යව පැවතුණි. | පිළිතුරු ලබා දි නොමැත. | වත්කම් උපයෝජනය කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.19.6 වෙනත් රාජ්‍ය ආයතන වලට ලබාදුන් සම්පත්**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුරුණෑගල නගරය උතුර ග්‍රාම නිලධාරි වසමේ දකුණු වැව රවුම ගම ඉඩම් කොටස් 1997 නොවැම්බර් 5 දින සිට වර්ෂ 30 සඳහා කුරුණෑගල සිංහ සමාජය වෙත බදු දී තිබුණි.මෙය සමිති කටයුතු සඳහා භාවිතා නොකර කඩ කාමර ඉදිකර පෞද්ගලික ආයතන සඳහා වානිජ පරමාර්ථයෙන් බදු දී තිබුණ බව නිරික්ෂණය වූ අතර අදාළ ඉඩම වානිජ පරමාර්ථයෙන් භාවිතා කල ද, වානිජ පදනම මත බදු අයකිරීමට කටයුතු සිදු කර නොතිබුණි. | ඉඩම වානිජ කටයුත්තක් මත පවතින බැවින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් බදු ගිවිසුම සංශෝධනයට අවශ්‍ය උපදෙස් ලබාගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | බදු ගිවිසුම් සංශෝධනය කර බදු අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කුරුණෑගල නගරයේ පිහිටි ටී.එස්.ටී.පී.58 දරන අවසාන ගම් සිතියමේ අංක 144/42 දරන බිම් කැබැල්ලෙන් පර්චස් 20 පමණ වූ බිම් කැබැල්ලක් ශ්‍රී ලංකා රජයේ වානිජ රෙදිපිළි නීතිගත සංස්ථාව වෙත 1974 ජුනි මස සිට වර්ෂ 30 ක කාලයක් බදු දී | බදු ගිවිසුම අවලංගු කර සන්තකය ආපසු ගැනීම පිණිස ඉදිරි කටයුතු කර ඇත. | සන්තකය ආපසු ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණ අතර විධිමත් බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.මෙම ඉඩම තුළ පිහිටා ඇති ගොඩනැගිලි වලින් කොටසක් පෞද්ගලික ආයතනයක් වෙත අතුරු බදු ලබා දී තිබුණි.මේ අනුව එම ආයතනය විසින් ඉඩම තුල කිසිදු ව්‍යාපාරික කටයුත්තක් නොකර වර්ෂ 49 කට ආසන්න කාලයක් කිසිදු බදු මුදලක් නොගෙවා, පෞද්ගලික ආයතනයක් වෙත මාසික රු.15000 ක මුදලකට අතුරු බදු දී තිබුණි. | | |
| **(ඇ)** | වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 1198 ගොළුවාව ග්‍රාම නිලධාරි වසමේ ගල්කැටියාගම ගමේ මු.පි.කු 1558 හි කැබලි අංක 01,03 හා 04 න් එකතුව හෙක්ටයාර් 2.88 ක් පුද්ගලයින් දෙදෙනෙකු වෙත 1987 මාර්තු 11 දින සිට වර්ෂ 30 ක කාලයක් සඳහා කෘෂිකාර්මික භෝග වගාව සඳහා දීර්ඝ කාලීන බදු වශයෙන් ලබාදී තිබුණි.මෙම බදුකාලය 2017 මාර්තු 11 දිනෙන් අවසන් වී ඇති අතර, බදු ගිවිසුම් දීර්ඝ කිරීමටද, කටයුතු නොකර 2018 වර්ෂයේ සිට 2021 වර්ෂ දක්වා රු.19,142ක් බදු වශයෙන් අයකර තිබුණද, ඉඩම් ආරවුලක් හේතුවෙන් ඉන්පසු බදු අයකිරීම නවතා තිබුණි. | නව බදුකර සකස් කිරීමට දීර්ඝ කාලයක් ගතවන බැවින් පෙර බදු මුදල අයකර ඇති අතර නව බදුකර සැකසූ පසු හිඟමුදල් අය කිරීමට කටයුතු කර ඇත. | නව බදුකර සකස්කරන තෙක් බදු ගිවිසුම් දිර්ඝ කර හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 394 කුලියාපිටිය ග්‍රාම නිලධාරි වසමේ අංක 978 අ.ග.පි.සිතියමේ අංක 09 එල් සහ 15 සි දරන ඉඩමේ පර්චස් 35 ක් වූ, ඉඩම් ප්‍රමාණයක් 1984 ජනවාරි 17 දින සිට වර්ෂ 30 ක කාලයක් සඳහා කුලියාපිටිය ලංකා බැංකුව වෙත බදු ලබාදී තිබුණු අතර බදු කාලය 2014 ජනවාරි 17 දින අවසන්ව තිබු නමුත් දෙවන බදු කාලය සඳහා බදුකර සකස් කර නොතිබුණි.මෙම බදු ගිවිසුම වෙනුවෙන් 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.1,173,642 ක හිඟ බදු මුදලක් අයවිය යුතුව තිබුණි. | දෙවන බදු කාලයට අදාළ අනුමැතිය ලබා ගැනීමට පළාත් ඉඩම් කොමසාරිස් වෙත යොමු කර ඇත. හිඟ මුදල් ගෙන ලෙස අවස්ථා ගණනාවකදි දැනුවත් කර ඇත. | නව බදුකර සකස්කර හිඟ බදු මුදල් ද අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 328, කිරිදිගල්ල ග්‍රාම නිලධාරි වසමේ කිරිදිගල්ල ගමේ පිහිටි කච්චේරි මිනින්දෝරු විසින් අදින ලද 2014/39 දරන දළ අනුරේඛනයේ කැබලි අංක A දරන ප්‍රමාණයෙන් අක්කර 09 රූඩ 03 පර්චස් 27.3 ක් පමණ වූ රජයේ ඉඩම් කොටසක් කෘෂිකාර්මික කටයුතු සඳහා අයෙකුට 2016 සැප්තැම්බර් 09 දින සිට වර්ෂ 30 කාලයක් සඳහාදීර්ඝ කාලීන බදු වශයෙන් ලබාදී තිබුණ අතර, මෙම ඉඩමේ කොටසින් අක්කර 02 ක් බදුකරු විසින් වෙනත් පුද්ගලයින් දෙදෙනෙකු වෙත නිත්‍යානුකූල අවසරයකින් තොරව ලබා දී තිබුණි. | බදු අනුමැතිය සංශෝධනය සඳහා හා ගත යුතු ඉදිරි ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් උපදෙස් ඉල්ලා ඇත. | බදුකරු හා ඉඩමේ අනෙකුත් බුක්තිකරුවන් සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විමසා හැකි ඉක්මනින් ක්‍රියාමාර්ග ගතයුතුය. |

**1.5.19.7** වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ---------------------------------------- | ------------ |
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් හා ඉලෙක්ට්‍රොනික් ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියෙන් වාහන 288 ක ලියාපදිංචිය සම්බන්ධයෙන් ලබාගත් තොරතුරු අනුව, වයඹ පළාත් සභාවේ ආයතන නමින් ලියාපදිංචි කර ඇති වාහන 38 ක් පළාත් සභාවේ ආයතන සතුව නොපැවතුණි. | කාර්යාලයේ පවත්නා ලේඛනවල සඳහන්ව නොමැති බැවින් සනාථ කළ නොහැක. | පළාත් සභාව නමින් ලියාපදිංචි වාහන අස්ථානගත වීම සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.19.8** මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------------- | ------------ |
| (අ) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) ගේ 2017 ඔක්තෝබර් 11 දිනැති අංක NWP/CS/L-01 දරන රාජකාරී පැවරීම් ලිපිය අනුව නීති නිලධාරිනියකට නිවාස හා ඉදිකිරීම් දෙපාර්තමේන්තුවේ රාජකාරි පවරා තිබුණු අතර, එහි පළාත් සභාව සම්බන්ධ නොතාරිස් කටයුතු වලදී නොතාරිස්වරයෙකු වශයෙන් සේවය ලබාදීමට අදාළ රාජකාරි පවරා තිබුණු | අදාල ගෙවීම සම්බන්ධයෙන් පවතින නීතිමය තත්වය පරීක්ෂා කරමින් පවතින අතර ඉදිරියේදී ඊට අනුකූලව කටයුතු කර විගණනය දැනුවත් කරන බව දන්වා ඇත. | අදාල ආයතනයේ රාජකාරි පවරන ලද නිලධාරියා විසින් පළාත් සභාවෙන් ලබාගන්නා වැටුප් හා දීමනාවලට අතිරේකව රාජකාරි පැවරීමට අදාල රාජකාරී ඉටුකිරීම වෙනුවෙන් දීමනා ගෙවීම |

| | | | |
|---|---|---|---|
| | නමුත් 2020, 2021, 2022 හා 2023 වර්ෂවල වයඹ පළාත් සභා අරමුදලට වැය බරක් වූ වයඹ නිවාස හා ඉදිකිරීම් සංවර්ධන අරමුදලේ ඉඩම් ඔප්පු ලිවීමේ ඔප්පු ගාස්තු හා අදාළ සේවා වෙනුවෙන් රු.544,425 ක් පළාත් සභා අරමුදලෙන් ගෙවා තිබුණි. | | සම්බන්ධයෙන් ඉහළ කළමනාකරණයේ අවධානය යොමුකළ යුතුය. |
| **(ආ)** | ආණ්ඩුකාරවර කාර්යාලය විසින් පවත්වන ලද කුරුණෑගල මහා නගර සභාවේ නගරාධිපතිවරයාට එරෙහි ඒක පුද්ගල පරීක්ෂණ සභාව සඳහා වයඹ පළාත් සභාවේ සේවයේ නියුතු නීති නිලධාරිනියක පත්කර, ඒ සඳහා රු.125,000 ක දීමනාවක් සමාලෝචිත වර්ෂයේදී පළාත් සභා අරමුදලින් ගෙවා තිබුණි. | ඒක පුද්ගල පරීක්ෂණ කටයුතු වෙනුවෙන් ආණ්ඩුකාරවරයා විසින් විධිමත් ලෙස අනුමත කරන ලද දීමනාවක් ගෙවා ඇත. | පළාත් සභා දීමනා ලබන නිලධාරීයෙකු රාජකාරී කාලය තුළ ඉටුකළ රාජකාරීන් වෙනුවෙන් අතිරේක දීමනා ගෙවීම පිළිබඳව අවධානය යොමු කළ අතර ආණ්ඩුකාර අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |

**1.5.19.9 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | --------------------------------------- | ------------ |
| **(අ)** | කොටවෙහෙර, ඉබ්බාගමුව, නිකවැරටිය, රිදීගම, පන්නල, වාරියපොල හා කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ට අදාළව දීර්ඝ කාලීනව බදු දී ඇති ඉඩම් කොටස් 23 වෙනුවෙන් බදු අනුමැතිය ලැබී වර්ෂ 1 $^{1}/_{2}$ සිටම වර්ෂ 23 දක්වා කාලයක් ගතවී ඇතත් බදු ගිවිසුම් සකස් කර බදු දීමට කටයුතු කර නොතිබුණි. | බදු ගිවිසුම් සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා ඇත. | බදු ගිවිසුම් ප්‍රමාදයකින් තොරව සකස් කර ගිවිසුම් වලට එළඹිය යුතු වීම. |
| **(ආ)** | නිකවැරටිය, කොටවෙහෙර, පොල්පිතිගම, ඉබ්බාගමුව හා පන්නල යන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ 5 ක 2023 දෙසැම්බර් 31 දිනට දීර්ඝකාලීන, එළදා හා වාර්ෂික බදු වශයෙන් රු.7,800,774 ක හිඟ බදු මුදලක් අයවිය යුතුව තිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට අදාළ බදුකරුවන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| **(ඇ)** | ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 116 නිනෝගම ග්‍රාම නිලධාරි වසමේ ගල්ලජ්ගම ගමේ බී.එස්.වී.ජී. 3829 හි කැබලි අංක 19 රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා සමාගමක් වෙත 2021 අගෝස්තු | පිළිතුරු ලැබී නැත. | රජයට ලැබිය යුතු බදු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | 10 දින සිට වසර 30 ක් සඳහා බදු වශයෙන් ලබා දී තිබුණි.මෙම ඉඩම් කොටස 2007 වර්ෂයේ සිට අදාළ පී.එල්.සී. සමාගම විසින් භුක්ති විද තිබූ අතර බදු අනුමැතිය ලබාදීමේදී අදාළ සමාගම විසින් ඉඩම කොටස භුක්ති විද තිබූ වර්ෂ 14 කාලය සම්බන්ධයෙන් අවධානය යොමු නොකර 2021 වර්ෂයේ සිට බදු අනුමැතිය ලබාදීම තුළින් 2007 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා 14 ක් සඳහා රජයට ලැබිය යුතු බදු මුදල් අහිමි වී තිබුණි. | | |
| (ඇ) | කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කටුගම්පොල දකුණු කෝරලේ කුලියාපිටිය ප්‍රාදේශිය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත් කනදූල්ලවැව ගමෙහි රූඩ් 01 ක් පමණ වූ රජයේ ඉඩම් කොටස ලං.ග.ම ඩිපෝවට අවශ්‍ය ළිඳක් ඉදිකිරීම සඳහා 1966 අගොස්තු 14 දින සිට වර්ෂ 30 ක් සඳහා ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත බදු දී තිබුණි. 1996 වර්ෂයේදී බදු කාලය අවසන්ව වර්ෂ 17 ක් පමණ ගතවී ඇතත්, දෙවන බදු කාලය සඳහා විධිමත් බදු ගිවිසුමකට එළඹ නොතිබුණු අතර 2020 වර්ෂයේ සිට රු.167, 670 ක බදු මුදලක් අයවිය යුතුව තිබුණි. | අදාළ බදු මුදල් ගෙවන ලෙස දැනුවත් කර ඇත. | හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | පන්නල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අංක 1550 දරන ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බඩබැද්ද වත්ත නැමැති ඉඩමෙන් රූඩ් 02 ක ඉඩම් කොටසක් පුද්ගලික ආයතනය විසින් 2011 වර්ෂයේ සිට දීර්ඝ කාලීන බදු පදනම මත ඉල්ලීම් කර තිබුණ නමුත් 2019 ඔක්තෝම්බර් 28 දින සිට වසර 30 කාලයක් සඳහා අදාළ ඉඩමේ කොටස මෙම ආයතනය වෙත දිර්ඝකාලින බදු ලබා දී තිබුණි.මෙම ඉඩම අදාළ බදුකරු විසින් 1987 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා භුක්ති විද වාර්ෂික බදු ගෙවා තිබූ අතර 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ද මෙම බදුකරුම අදාළ ඉඩම භුක්ති විද තිබුණද,වර්ෂ 09 කට අදාළ බදු මුදල් අයකර ගෙන නොතිබිණි. | අදාළ වර්ෂ 09 ක කාලය සඳහා අයනොකළ බදු අයකරගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | පෙර වර්ෂ සඳහා හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | වාරියපොල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පොතුවැව ගමෙහි පිහිටි අ.ග.පි.2493 අතිරේක 4 වැනි පිඹුරේ අංක 170 දරන හෙක්ටයාර 5.206 ක මොරගොඩ මූකලාන සෝගම් වත්ත ඉඩම 1993 මැයි 28 දින සිට වර්ෂ 30 දිර්සකාලින බදු යටතේ පුද්ගලයෙකුට ලබා දී ඇති අතර,2023 මැයි 28 දින බදු කාලය අවසන්ව තිබුණි.බදු ඉඩම ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය මත අංක 604 බදු පැවරුම්කරය මඟින් ඉහත බදු ගැනුම්කරුගේ පුත්‍රයකු වෙත පවරා තිබුණි. නමුත් එම බදුකරු සමඟ විධිමත් බදු ගිවිසුමකට එළඹ නොතිබීම හේතුවෙන් නව තක්සේරුවක් යටතේ බදු මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ඉඩම් පැවරීමට අදාළ ලිපි ලේඛන සකස් කර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමුකර ඇත. | නව තක්සේරු යටතේ ගිවිසුම්ගත වී බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.20 ශීර්ෂය 262 - පළාත් ප්‍රතිපත්ති සම්පාදන හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව**

**1.5.20.1 අපේක්ෂිත නිමවුම් (out put) ලබා නොගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සැලසුම් දෙපාර්තමේන්තුව විසින් මුළු පිරිවැය රු.3,911,764 ක් වූ මොඩියුලර් 06 කින් සමන්විත අන්තර් ජාල පදනම් කරගත් තොරතුරු කළමනාකරණ පද්ධතිය නිර්මාණය කිරීමේ වැඩසටහන් සඳහා 2019 හා 2020 වර්ෂයන්හි මොඩියුල 1, 2 හා 5 සඳහා රු.1,365,822 ක් ගෙවා තිබුණු අතර, ඊට අමතරව මොඩියුල සඳහා අත්තිකාරම් මුදල් ලෙස රු.1,350,000 ක් ගෙවා තිබුණි. ඒ අනුව 2018 හා 2019 වර්ෂයන් හි වියදම් කළ මුළු මුදල රු.2,715,822 ක් වුවද වසර 04 කට අධික කාලයක් ගතවී ඇතත්, පළාත් සභාවට මෙම පද්ධතිය තුළින් අපේක්ෂිත නිමවුම ලබා ගැනීමට අපොහොසත් වී ඇති බවත්, එනම් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය අනුව මොඩියුල 03 ක් නිම වූ මට්ටමේ පැවතියද මුළු ව්‍යාපෘතියේ වටිනාකමින් සියයට 69 කට වඩා වසර 05 කට පෙර ගෙවා තිබූ නමුත් අපේක්ෂිත නිමවුම/ ප්‍රතිලාභ පළාත් සභාවට ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම පද්ධතිය නිර්මාණය කිරීමේ කටයුතු මොඩියුල වශයෙන් බෙදා වෙන් කර ඇත. මුදල් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්ෂික මූලධන අවශ්‍යතා තක්සේරුව සහ මාධ්‍ය කාලින සංවර්ධන සැලැස්ම සකස් කිරීමට අදාල මොඩියුලය සම්පූර්ණයෙන් නිම කර ඇත. වාර්ෂික සංවර්ධන සැලස්ම සකස් කිරීමට අදාල මොඩියුලය සම්පූර්ණයෙන්ම නිම කර ඇත. මූලා කටයුතු පිලිබඳ මොඩියුලය නිම නිම කර ඇති අතර එම ව්‍යාපෘතියේ කටයුතු 95% පමණ මේ වන විට අවසන් කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව කාර්යය නිම කර අපේක්ෂා අරමුණු ඉටු කර ගැනිමට කටයුතු කළ යුතුය. |

## 1.5.21. ශීර්ෂය 263 - පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

### 1.5.21.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 හා 2023 වර්ෂවල දේපළ පැවරුම් ඔප්පු 81 කට අදාළව පනවන ලද අතිරේක මුද්දර ගාස්තු වටිනාකම වූ රු.14,150,335 කින් රු.9,506,996 ක් වූ මුද්දර ගාස්තු නිදහස් කර තිබුණු අතර, අයකළ මුද්දර ගාස්තු වටිනාකම රු.4,643,339 ක් විය. ඒ අනුව පනවා තිබූ මුද්දර ගාස්තු වටිනාකමින් සියයට 67 ක් වැඩියෙන් නිදහස් කර තිබුණි. | 2022 හා 2023 වර්ෂ වලට අදාල අතිරේක මුද්දර ගාස්තු පැන වූ ඔප්පු සංඛ්‍යාව 4952 කින් බද්ද හෝ දඩය කොටසක් නිදහස් කල ඔප්පු සංඛ්‍යාව 81 විය.එය අතිරේක මුද්දර ගාස්තු පැන වූ ඔප්පු සංඛ්‍යාවෙන් 1.63% කි. 1990 අංක 08 දරණ වයඹ පළාත් සභා මුදල් ප්‍රඥප්තියේ 79(1) හා 79(11) වගන්තිය ප්‍රකාර අභියාචනා විසදීමේදි සම්පූර්ණයෙන් බද්ද හෝ කොටසක් නිදහස් කල හැකිවේ. ඒ අනුව සම්පූර්ණ දඩය හෝ ඉන් කොටසක්ද නිදහස් කර සංශෝධිත තක්සේරු නිකුත් කර අතිරේක මුද්දර ගාස්තු අය කර ගැනීම සිදු කරයි. | නියමිත මුද්දර ගාස්තු වටිනාකම අයකරගත යුතු බව. |
| (ආ) | 2018 සිට 2022 වර්ෂවලදී ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයේ ලියාපදිංචි දේපළ පැවරුම් ප්‍රමාණය 345,733 ක් වූ අතර, පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට යොමුකළ දේපළ පැවරුම් 77,795 ක ප්‍රමාණයෙන් දේපළ පැවරුම් 10,239 කට අදාළව අතිරේක මුද්දර බදු අයකිරීමට කටයුතු කර තිබුණි. එය පළාත් ආදායම් දෙපාර්තමේන්තුවට යොමු කළ දේපල පැවරුම් ප්‍රමාණයෙන් සියයට 13 ක් තරම් සුළු ප්‍රමාණයක් විය. | එසේම පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු තක්සේරු නිලධාරීන් සංඛ්‍යාව 15 ක් වන අතර බදු නිලධාරීන් සිටින්නේ එක් අයෙකු පමණි. එසේම දෙපාර්තමේන්තුවෙහි කොමසාරිස් හා නියෝජ්‍ය කොමසාරිස් තනතුරු සියල්ල කලක සිට පුරප්පාඩුව පවති. එම පුරප්පාඩු කොමසාරිස් තනතුරේ රාජකාරි ඉටු කරනු ලබන්නේද ජ්‍යෙෂ්ඨ තක්සේරු නිලධාරියෙකු විසිනි. තක්සේරු කිරීමේ කටයුතු වලට අමතරව තොරතුරු රැස් කිරීම,ඒවා පරීක්ෂා කිරීම, අය කිරීම, මුද්දර ගාස්තු රැස් කිරීමට අදාල අනිකුත් කටයුතු පවත්වාගෙන යනු ලබන්නේ මෙම සීමිත නිලධාරී සංඛ්‍යාවයි. එම නිසා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ධාරිතාව අනුව කටයුතු කළ හැකි උපරිම ධාරිතාවයෙන් කටයුතු කරනු ලැබේ. එම නිසා පරීක්ෂා කරන ඔප්පු සංඛ්‍යාව සේවයේ නියුතු නිලධාරි සංඛ්‍යාවට සීමා වී ඇත. | අතිරේක මුද්දර බදු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.21.2 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව හා අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------------------- | -------------------- | ------------- |
| 1990 අංක 08 දරන මුදල් ප්‍රඥප්තියේ 104(අ) (3) (ආ) වගන්තියට අනුකූල නොවන පරිදි වයඹ පළාත් ආදායම් දිරි ගැන්වීමේ යෝජනා ක්‍රමය යටතේ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන් නොවන වයඹ පළාත් සභාවේ කාර්ය මණ්ඩලයට අයත්, දිරි දීමනා අනුමත කිරිමේ කමිටුවේ නිලධාරින් 04 ක් වෙත සමාලෝචිත වර්ෂයේ පළමු අර්ධ වර්ෂයට අදාළව එකතුව රු.473,165 ක් ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය සහතික කිරීමේ කාර්යය සඳහා මෙම නිලධාරීන් විසින් ඍජුවම අධීක්ෂණ කාර්යයක නියැලෙමින් දෙපාර්තමේන්තුවේ කටයුතු මෙහෙයවීමට දායකත්වයක් දරනු ලැබේ. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් නියමිත ආදායම් ඉලක්කයන් කරා මෙහෙය වීමට දිරි දීමනා අනුමත කිරිමේ කමිටුව ඍජු දායකත්වයක් ලබාදෙන හෙයින්, මෙම දෙපාර්තමේන්තු නොවන නිලධාරීන් 04 දෙනා සඳහා දිරි දීමනා ගෙවීම ගැටලුවක් නොවන බව සඳහන් කරමි. මීට අමතරව බදු කපාහැරීම් අවස්ථා පැන නගින ගොනු සමාලෝචනයට ලක් කර, එම ගොනු වලට අදාල තීරණ ගැනිමද මෙම කමිටුව මගින් සිදු කරනු ලබයි. | මුදල් ප්‍රඥප්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.22 වාණිජ අත්තිකාරම් ගිණුම්**

**1.5.22.1. වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ ගිණුම් අංක 24303 දරන "පේෂකර්ම මධ්‍යස්ථාන පවත්වාගෙන යාම "සඳහා වූ වාණිජ අත්තිකාරම් ගිණුම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------- | --------------------------------------- - | ------------ |
| 2023දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පේෂ කර්ම ණයගැති ශේෂය රු.46,579,904 ක් වූ අතර එම ශේෂය තුළ වර්ෂ 02 සිට වර්ෂ 24 දක්වා කාලයක සිට අයවිය යුතු රු.9,880,130 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද අයකරගෙන නොතිබුණි. | රු.505,295,059 ක මුදල කපා හැරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා පළාත් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කර ඇති අතර සළුසල ආයතනයට අයත් රු.3,204,354 ක මුදල අයකර ගැනීමට නීත්‍යානුකූල කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී තීරණය කළ බව දන්වා ඇත. | පසු ගිය ණය ශේෂයන් කාර්යක්ෂමව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | | අලෙවි සැල් යටතේ ඇති 2012 වර්ෂයේ ණය ශේෂ සම්බන්ධයෙන් නිතීපති වෙත යොමු කර ඇති අතර 2013, 2014 වර්ෂ වල ණය ශේෂ වලට අදාළව විනය නියෝග ලද පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමත් 2017 වර්ෂයේ ණය සියල්ල ගෙවා අවසන් කර ඇති බවත් දන්වා ඇත. | |

**1.5.22.2 වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගිණුම් අංක 25102 දරන " ගොවිපල කටයුතු මෙහෙයවීම හා බිත්තර වී සැපයීම"සඳහා වූ වාණිජ අත්තිකාරම් ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------------- - | ------------ |
| (අ) | ගල්ගමුව රජයේ ගොවිපලේ පවතින 2022 වර්ෂයේ පෙබරවාරි 02 දින වැඩ අවසන් කර භාරදී තිබුණු රු.3,662,756 ක් වටිනා ලූණු ගබඩාව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි. | පිළිතුරු ලබා දී නොමැත. | නිෂ්කාර්යය වත්කම් අදාළ අරමුණට යෙදවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වන්නිගම ඒකාබද්ධ ගොවිපල සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානයේ සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.12,575,277 ක් වූ අතර, මුළු පුනරාවර්තන වියදම සහ මූලධන වියදම පිළිවෙලින් රු.34,007,822 ක් සහ රු.1,543,609 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදමවත් ආවරණය කරගැනීමට ප්‍රමාණවත් ආදායමක් ගොවිපල විසින් උපයාගෙන නොතිබුණි. | වන්නිගම ගොවිපලේ ආසන්න වසර කිහිපයක ආදායම අනුව 2022 සිට 2024 සිට මාසික සාමාන්‍ය ආදායම දළ වශයෙන් දෙගුණයක් වී ඇත. මේ ආකාරයට ඉදිරියටත් ආදායම වර්ධනය කර ගැනීමට සැලසුමක් අනුව මේ වන විට ක්‍රියාත්මක කරමින් පවතී. ඒ ආකාරයට ඉදිරියේ දී පුනරාවර්තන වියදම් ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන බව දන්වා ඇත. | ගොවිපල කටයුතු විධිමත් පරිදි සැලසුම් කර වාර්ෂික ඇස්තමේන්තුගත ආදායම ඉපයීමටත්, පුනරාවර්තන වියදම් පාලනය කිරීම තුළින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

**1.5.22.3. විෂයය අංක 25003 දරන වාරියපොල පටක රෝපණ විද්‍යාගාර වාණිජ අත්තිකාරම් ගිණුම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------------- | ------------ |
| (අ) | වර්ෂ ගණනාවක සිට පටක රෝපණ විද්‍යාගාර වාණිජ අත්තිකාරම් ගිණුමට අදාලව වියදම පියවා ගැනීමට ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමට නොහැකිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට ක්ෂය සංචිත අරමුදලට ගෙවිය යුතු අගය රු.7,077,921 ක් විය. | වාණිජ අත්තිකාරම් ගිණුමෙන් ලැබෙන ආදායම් මත ඉදිරියේදී පියවීමට කටයුතු කරන බව දන්වා ඇත | ආදායම් වර්ධනය කරගෙන පියවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මාවතගම ඩෙනවර්වත්ත රජයේ ගොවිපලේ 2019 වර්ෂයේ සිට ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන පටක රෝපණ විද්‍යාගාරය පිහිටි භූමි ප්‍රමාණයේ අයිතිය පවරාගැනීම සහ එහි වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි. | ඉඩම තක්සේරු කර ඇත. ඒ අනුව ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුළත් කිරීමටත් 2024 මූල්‍ය ප්‍රකාශ වලට ඇතුළත් කිරීමෙන් සටහන් කර ගත් බව දන්වා ඇත. | භාවිතා කරනු ලබන ඉඩම්වල අයිතිය පවරා ගැනීමටවත් එහි වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමටත් කටයුතු කළ යුතුය. |

**1.5.22.4. විෂය අංකය 26002 දරන වයඹ පුහුණු ආයතනයේ වාණිජ අත්තිකාරම් ගිණුම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 100KVA තෙකලා විදුලි ජනක යන්ත්‍රයක් 2022 මාර්තු 28 දින වයඹ පුහුණු ආයතනයේ ස්ථාපිත කිරීමට සඳහා රු.15,922,298 ක් ප්‍රධාන ලේකම් කාර්යාලය විසින් වැය කර තිබුණු ද, විගණිත දිනය වූ 2024 මාර්තු 02 වන විටත් එය භාවිතයට ගෙන නොතිබුණි. | අද වන විට විදුලි ජනක යන්ත්‍රයේ සියලුම අලුත්වැඩියා කටයුතු සිදු කර අවසන් බවත් භාවිතයට ගැනීමට හැකි බවත් දන්වා ඇත. | ස්ථාවර වත්කම් කාර්යක්ෂමව භාවිතයේ යෙදවිය යුතුය. |

**1.5.23 අනෙකුත් අත්තිකාරම් ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් යටතේ අයවිය යුතු හිඟ ශේෂය රු.1,430,298,716 විය. | 2024 වර්ෂය තුළ පියවීමට කටයුතු කරන බව දැනුම් දී ඇත. | හිඟ ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.24. වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මානව සම්පත් සංවර්ධන අධිකාරිය විසින් 2006 – 2017 කාලපරිච්ඡේදය තුල ව්‍යාපෘති 08 ක් වෙනුවෙන් පුද්ගලයින් 178 දෙනෙකු සඳහා ලබාදී තිබුණු රු.24,286,413 ක ණය මුදලින් 2023 දෙසැම්බර් 31 දින වන විට රු.7,502,349 ක් අයවීමට පැවතුණි. | විගණනය විසින් පෙන්වා දී ඇති ණය ශේෂයන්ට අදාලව 2023.05.31 දින පැවති රු.8,992,220.00 ක් වූ මුදල 2023.12.31 දින වන විට රු.7502349.00 ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය. | දිගු කාලීන හිඟ හිටි ණය නොපමාව අය කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට තනි පුද්ගල ණය 193 ක් සඳහා ලබා දී තිබූ රු.24,786,413 කින් වසර 05 ඉක්මවා 2023 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ මුදල රු.7,821,459 ක් හෙවත් සියයට 32 ක් හා ඊට අදාළව පොළිය රු.2,668,003 ක් විය. | 2023.05.31 දින පැවති රු.12,430,165 ක්වූ මුදල 2023.12.31 දින වන විට රු.10,489,462 ක් දක්වා අඩු කර ගැනීමට හැකි විය. තවද 2024 වර්ෂයේ අය කිරීම ශක්තිමත් කිරීම උදෙසා මෙය වාර්ෂික සංවර්ධන සැලැස්මට ද ඇතුලත් කරන ලදී. | හිඟ හිටි ණය නොපමාව අය කරගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් පවිත්‍රතා සේවාව සපයා තිබුණු ආයතන 64 කින් බිල්කළ ආදායම රු.390,732,589 කින් රු.167,161,682 ක් අයකරගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | මුළු ආදායම ඉපයීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහගෙදර නිවාඩු නිකේතනයෙන් අවස්ථා 27 කට අදාළව ශාලා කුලී හා කාමර කුලී ආදායම් රු.434,700 ක් අයකරගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.25 වයඹ ජනකලා පදනම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------------ | ------------------------------------------------ | ------------ |
| (අ) | ආයතනයෙහි පසුගිය කාලයෙහි ගුණාත්මක හා වගකීමෙන් යුතු හොඳ ආදායම් මාර්ගයක් වූ “ශ්‍රී සුභ මංගලම්” සේවය ආදායම් නොමැති තත්ත්වයකට පත් වීම, වයඹ තරංග ශබ්ද පද්ධතිය කුලියට දීමෙන් ආදායම් වර්ධනය කර ගැනීමට ක්‍රියා මාර්ග නොගැනීම, ශබ්ධාගාරයෙහි ආදායම් උත්පාදනයට කටයුතු නොකිරීම, එළිමහනේ රංග පීඨය හරහා ආදායම් උත්පාදනයට කටයුතු නොකිරීම යන කරුණු හේතුවෙන් ආදායම් පහත වැටීමක් සිදුව තිබුණි. | වයඹ ජනකලා පදනමේ සංස්කෘතික අංශයේ ආදායම් උත්පාදන ව්‍යාපෘති වශයෙන් ක්‍රියාත්මක කරනු ව්‍යාපෘතිවල 2023 වර්ෂයේ අපේක්ෂිත ආදායම් ඉලක්ක විවිධ හේතු මත ළඟාකර ගැනීමට නොහැකි වී ඇත. | ආදායම් වර්ධනය කරගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | 2023 වර්ෂයේදී අලෙවිය සඳහා මිලදීගත් මුළු වටිනාකම වූ රු.20,794,508 ක් වූ භාණ්ඩවලින් සියයට 45 ක් එනම් රු.9,283,361 ක භාණ්ඩ, පදනමට අදාල ප්‍රඥප්තියේ අරමුණුවලට අනුකූල නොවන පරිදි වයඹ පළාතෙන් පිට සැපයුම්කරුවන්ගෙන් මිල දී ගෙන තිබුණි. | ආයතනයේ අඛණ්ඩ පැවැත්ම ආරක්ෂා කර ගැනීම සඳහා ජනකලා පදනමේ ප්‍රධාන ආදායම් මාර්ගය වන අලෙවිසැල් ආදායම ඉහළ නංවා ගැනීම මෙන්ම සෙසු රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අලෙවිසැල් සමඟ තරඟකාරීව කටයුතු කිරීමට සිදුව ඇත. | පදනමේ අරමුණු ඉටු කිරීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය. |

## 1.5.26 පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වයඹ පළාතේ සියලුම පෙර පාසල් වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය යටතේ ලියාපදිංචි කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වයඹ පළාත තුළ ක්‍රියාත්මක පෙර පාසල් 2152 කින් පෙර පාසල් 910 ක් ලියාපදිංචි කර නොතිබුණි. ඒ අනුව වයඹ පළාතේ පිහිටි පෙර පාසල් සංඛ්‍යාවෙන් සියයට 42 ක් ආයතනයේ නියාමනයට ලක් වී නොතිබුණි. | මෙම පෙර පාසල් 386 ට අයත් වන්නේ අන්තර්ජාතික ඉලක්ක වලට අදාළ වන පෙර පාසල් ද, අධිකාරියේ අවසරයක් හා නිසි ප්‍රමිතියකින් තොරව ආරම්භ කර ඇති පෙර පාසල් ද වේ. ප්‍රඥප්තියේ මෙම පෙර පාසල් වලට ගත යුතු නීතිමය පියවර සඳහන් කර නොමැති බැවින් මීට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වුවද ඉදිරියේ දී ප්‍රඥප්ති සංශෝධනයක් තුලින් නිසි ක්‍රියාමාර්ග ගැනිමට බලාපොරොත්තු වන බව සඳහන් කර ඇත. | පූර්ව ළමා සංවර්ධන ආයතන ලියාපදිංචි කළ යුතු අතර ඊට අනුකූල නොවන ආයතන සම්බන්ධව නීතිමය කටයුතු කළ යුතුය. |
| (ආ) | 2003 අංක 04 දරන පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය තුළ පෙර පාසල් ප්‍රමිතියෙන් තොරව ආරම්භ කිරීමේදී එය වසාදැමීමේ බලය නොමැති වීම, පෙර පාසල් වසර 02 කට වරක් ලියාපදිංචිය අලුත් කළ යුතු බවට ගෙන තිබූ කළමනාකරණ තීරණය ක්‍රියාත්මක නොවීම, පෙර පාසල් ආරම්භ කිරීම සහ නිවාඩු ලබාදීම සම්බන්ධව පොදු ප්‍රතිපත්තියකට අනුව කටයුතු කළ නොහැකි වීම, සුදුසුකම් නොමැති අය පෙර පාසල් ගුරු සහායකයන් ලෙස පත්වීමේදී ඒ සම්බන්ධව කටයුතු කිරීමට බලය නොමැති වීම කරුණු සම්බන්ධව නීතිමය ප්‍රතිපාදන නොමැති වීම තුළ ප්‍රඥප්තියේ සඳහන් අරමුණු කරා ළඟාවීම සම්බන්ධව ගැටලු සහගත තත්ත්වයක් පැවතුණි. | වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තියට අනුව පෙර පාසල් වසා දැමීමේ බලය නොමැති බැවින් ප්‍රඥප්ති සංශෝධනය කිරීමෙන් අනතුරුව මේ සඳහා ක්‍රියා මාර්ග ගැනීමට බලාපොරොත්තු වන බවත්, පෙර පාසල් ලියාපදිංචිය අලුත් කිරීමේ කටයුතු ආරම්භ කර, මේ වන විට ලියාපදිංචිය අලුත් කිරීමේ අයදුම්පත්‍ර 54 ක් ලැබී ඇති බවත්, සැම වසර 2කට වරක්ම ලියාපදිංචිය අලුත් කරන බැවින් උක්ත ගැටළුව මඟහරවා ගත හැකි බවත්, සුවිශේෂී හේතු මත පාසල් වාර සැලැස්මේ සඳහන් දිනයට පෙර ඇතැම් පෙර පාසල් ආරම්භ කර ඇති අතර යම් යම් ගලපා ගැනීම් සිදු කර ගැනීම සඳහා එසේ සිදු කර ඇති බවත් දැනට පූර්ව ළමා සංවර්ධන නිලධාරීන් විසින් අධ්‍යාපන සුදුසුකම් සපුරාගත් සහායක ගුරුවරුන් පමණක් බඳවා ගැනීමට උපදෙස් ලබා දී ඇති බවත් දන්වා ඇත. | පූර්ව ළමා සංවර්ධන ආයතන ලියා පදිංචි කළ යුතු අතර ඊට අනුකූල නොවන ආයතන සම්බන්ධ නීතිමය කටයුතු සිදු කිරීම, කළමනාකරණ තීරණවලට අනුකූලව කටයුතු කිරීම. පොදු ප්‍රතිපත්තියට අනුව හැකි සෑම විටම ක්‍රියා කිරීම හා සුදුසුකම් සපුරාගත් නිලධාරීන් පමණක් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.27 වයඹ පළාත් පරිසර අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වයඹ පළාත් පරිසර අධිකාරියේ විධායක නිලධාරීන් හට නෛතික ප්‍රතිපාදනයන් නොමැතිව 2015 සිට 2023 දෙසැම්බර් 31 දින වන විට විධායක දීමනා ලෙස රු.4,525,000 ක් ගෙවා තිබුණි. | මේ සඳහාද පරීක්ෂා කර කරුණු වාර්තා කිරීම සඳහා පරීක්ෂණ මණ්ඩලයක් පත් කර ඇති අතර ඒ අනුව 05/2017 චක්‍රලේඛය වයඹ පළාත් සභාවේ ව්‍යවස්ථාපිත 2017.10.25 දින සිට අදාල කර ගෙන ඇත. ඒ අනුව ඊට පෙර කාලපරිච්ඡේද සඳහා වැඩිපුර ගෙවා ඇති මුදල් ආපසු අය කිරීමට කටයුතු කරමින් පවතින අතර අය කිරීම් පිළිබඳ තොරතුරු ඉදිරියේදී වාර්තා කරන බව දන්වා ඇත. | චක්‍ර ලේඛ විධිවිධාන වලට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් පරිසර අධිකාරිය විසින් ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.5.4 වගන්තියට පරිබාහිරව නෛතික ප්‍රතිපාදන නොමැතිව සහකාර අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම වෙනුවෙන් 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා නිලධාරීන් 3 දෙනෙකුට රු.2,326,163 ක් ගෙවීම් කර තිබුණි. | i. වයඹ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක NWP/CM/AD/11/6/5 හා 2023.01.25 දිනැති ලිපියට අනුව ගෙවීම් සිදු කර ඇත.<br>ii. වයඹ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක NWP/CM/AD/11/6/5 හා 2023.05.03 දිනැති ලිපියට අනුව ගෙවීම් සිදු කර ඇත.<br>iii. NWP/CM/AD/11/6/5 හ2022.09.26 දිනැති ලිපියට අනුව ගෙවීම් සිදු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව වැඩ බැලීමේ පත්වීම් සිදුකළ යුතු අතර, නෛතික ප්‍රතිපාදන නොමැතිව ගෙවා ඇති මුදල් ආපසු අයකරගත යුතුය |
| (ඇ) | වයඹ පළාත් ප්‍රධාන ලේකම්ගේ 2014 ජනවාරි 28 දිනැති 01/2014 අංක දරන චක්‍රලේඛයේ 1.2.1 වගන්තිය හා සංශෝධනයන්ට අනුකූල නොවන ලෙස වයඹ පළාත් පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ විසින් නිල වාහනයක් ලෙස වෙන්කර තිබුණු වාහනය සඳහා අනුමත සීමාව ඉක්මවා රු.1,007,363 ක් වටිනා ඉන්ධන ලීටර් 2401.3 ක් ලබාගෙන තිබුණි. | නිල වාහනයක් ලෙස වෙන් කර තිබුණද අධිකාරියේ වාහන හිඟකම මත සංචිත වාහනයක් ලෙස නිරන්තරයෙන් භාවිතා කිරීමට සිදු වීම හේතුවෙන් ගරු ආණ්ඩුකාරවර අනුමැතිය ලබා ගැනීමට අවශ්‍යය කටයුතු සිදු කර ඇත. | වැඩිපුර භාවිතා කළ ඉන්ධනවල වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය.. |

**1.5.28 වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2001 අංක 01 දරන වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්ති 23 (1) වගන්තිය අනුව වයඹ පළාත් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ ix වැනි පරිච්ඡේදයේ 115 වගන්තිය සහ ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12.2.3 වගන්තියට අනුකූල නොවන පරිදි ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරියේ කළමනාකරණ අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ නියෝජ්‍ය සැලසුම් අධ්‍යක්ෂවරයෙකු පත්කර 2017 ජූනි 01 දින සිට 2023 නොවැම්බර් 30 දක්වා රු.1,572,148 ක් ගෙවීම් කර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | නීති රීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ණය යෝජනා ක්‍රමයේ ව්‍යවස්ථාවට අනුකූල නොවන පරිදි වැඩබැලීම සඳහා තාවකාලිකව අනුයුක්ත කර ඇති කෘෂිකර්ම අමාත්‍යාංශ නිලධාරීන් 06 දෙනෙකුට රු.600,000 ක ණය ලබාදී තිබුණු අතර,එම නිලධාරීන් 06 දෙනා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන්ද ආපදා ණය ලබාගෙන තිබුණි. | මෙම ව්‍යවස්ථාව අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015.04.29 දින අනුමත කර ඇත. එම කාලසීමාව තුල පැවති මූල්‍ය තත්වය සැළකිල්ලට ගෙන මෙම සීමාවන් හා කොන්දේසි පනවා ඇත. නමුත්, මෙම ණය ලබාගෙන ඇති බවට විගණනය විසින් දක්වා ඇති නිළධාරීන් 06 දෙනා අධිකාරියට අනුයුක්තව හා වැඩබැලීමේ පදනම මත සේවය කළද, එම නිළධාරීන් ද රජයේ ස්ථිර සේවකයින් වේ. කෙසේ වෙතත් විගණනය විසින් දැන්වූ පසු මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ස්ථිර නිලධාරීන් නොවන අනුයුක්ත කළ නිලධාරීන්ට ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරී ප්‍රඥප්තියට පටහැනිව ණය ලබාදීම් සිදු නොකළ යුතුය.. |

**1.5.29. වයඹ කර්මාන්ත සේවා කාර්යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යාංශය සඳහා අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් නොමැතිව 2013 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා නිලධාරීන් 17 දෙනෙකු බඳවාගෙන 2022 හා 2023 වර්ෂයන්හිදී පිළිවෙළින් රු.10,936,955 හා රු.9,773,857 ක් වශයෙන් වැටුප් ලෙස එකතුව රු. 20,710,812 ක් ගෙවා තිබුණි. | කර්මාන්ත සේවා කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි එම බඳවා ගැනීම් සිදු කළ අතර ඒ වෙනුවෙන් වැටුප් හා වේතන ද ගෙවා ඇත. | බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගෙන, අදාළ තනතුරු වෙනුවෙන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | හෙරලියාවල කර්මාන්තපුරය තුළ ක්‍රියාත්මක ආයතන හා කර්මාන්ත සේවා කාර්යාංශය සමඟ වසර 20 ක කාලයක් සඳහා එළඹී ඇති බදු ගිවිසුම් ප්‍රකාරව එක් එක් ආයතනය විසින් වාර්ෂික බදු කුලිය සෑම බදු වර්ෂයකම මැයි 31 දිනට පෙර ගෙවිය යුතු වුවද 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 16 කට අදාළව එකතුව රු.957,897 ක බදුකුලී අදාළ ආයතන මගින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණිත දින වනවිට කල්බදු කුලිය ලෙස රු 957,897.00 ක් අයවිමට තිබුණ ද වර්තමානය වන විට එනම් 2024 අප්‍රේල් මාසය වන විට රු. 303,048.10 අයවී ඇති බව දැන්වීමට කැමැත්තෙමි. එම දින වන විට කල්බදු හිඟ හිටි ප්‍රමාණය රු. 699,552.43 දක්වා අඩු වී තිබුණි. හැකි ඉක්මනින් ඉතිරි ප්‍රමාණයද අයකර ගැනීමට කටයුතු කරන බවද දන්වා සිටිමි. | හිඟ මුදල් අදාළ ආයතන වෙතින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | හෙරලියාවල කර්මාන්තපුරය තුළ ක්‍රියාත්මක වන ආයතන 57 කින් ආයතන 56 ක්ට අදාළව 2023 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.955,194 ක හිඟ ජල බිල්පත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණිත දින වන විට හිඟ ජල බිල් පත් රු.955,194 ක් අයවීමට තිබුණු අතර වර්තමානය වන විට එනම් 2024 අප්‍රේල් 31 වන විට රු.236,338 ක ශේෂයක් දක්වා අඩුකර ගෙන ඇත. ඉතිරි හිඟ ශේෂයන් ද කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරමි. | හිඟ මුදල් අදාළ ආයතන වෙතින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| **(ඈ)** | 2023 වර්ෂයේ අගෝස්තු 24 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ අංක 05 ඡේදය අනුව හෙරලියාවල කර්මාන්තපුරය තුළ දැනට ක්‍රියාත්මක හා ක්‍රියාත්මක නොවන ආයතන මගින් 2006 සිට 2016 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව කර්මාන්ත සංවර්ධන අරමුදල (IPF) වෙත අයකර ගත යුතු රු.3,299,488 ක් අයකර ගෙන නොතිබුණි. | ඒ පිළිබඳ ඉදිරියේ දී අදාල ක්‍රියාමාර්ග ගන්නා බව සඳහන් කිරීමට කැමැත්තෙමි. ඊට අමතරව මේ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් උපදෙස් ක්‍රියාත්මක කිරීමට ද ඉදිරියේ දී කටයුතු කරන බව දන්වා ඇත. | අයකර ගත යුතු මුදල කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඉ)** | පළාත් මුල්‍ය රීති 261.2.2 ට අනුකූල නොවන පරිදි රු.100,000 ක උපරිමය ඉක්මවා කාර්යාංශයේ නිලධාරීන් 06 ක් වෙත අවස්ථා 20 කදී එකතුව රු.3,668,900 ක් අතුරු අග්‍රිම ලබා දී තිබුණි. | එවැනි මුදලක් අත්තිකාරම් ලෙස ලබාගෙන ඇත්තේ ව්‍යාපෘතිවලට අදාළ සහභාගීවන්නන්ගේ දෛනික දීමනා ගෙවීම සඳහාම පමණක් බව තහවුරු කරන බව දන්වා ඇත. | පළාත් මුල්‍ය රීති ප්‍රකාරව අනුමත සීමාවට යටත් වන පරිදි අත්තිකාරම් නිකුත් කළ යුතුය. |
| **(ඊ)** | සමාලෝචිත වර්ෂයේදී කර්මාන්ත සේවා කාර්යාංශය මගින් ක්‍රියාත්මක PLASTICS ව්‍යාපෘතිය සඳහා භාවිතා කිරීමට එම ව්‍යාපෘතියෙහි අරමුදල් යොදවා එක් වර්ෂයක කාලයක් සඳහා මාසිකව රු.240,000 ක කුලී පදනම මත වාර්ෂිකව රු.2,880,000 ක වටිනාකමකට ටොයෝටා වර්ගයේ ඩබල් කැබ් රථයක් ප්‍රධාන කොන්ත්‍රාත් වැඩ හා මිලදී ගැනීමේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියෙන් ප්‍රසම්පාදනය කර තිබූ අතර එම ප්‍රසම්පාදන | ප්‍රසම්පාදන කමිටු අනුමැතියට යටත්ව මාසික කුලිය පදනම්ව සිදුකර ඇති බව දන්වා ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කමිටුවෙහි සංයුතිය තුළ කමිටු සමාජිකයෙකු ලෙස වයඹ ප්‍රධාන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී සහ අධ්‍යක්ෂක (ව්‍යාපෘති කළමනාකරණ හා උපදේශක සේවා) ඇතුළත් වියයුතු වුවත්, එම නිලධාරීන් නොමැතිව කාර්යාංශයේ සේවයේ නියුතු නිලධාරීන් පමණක් සහභාගි කර ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි.ඩබල් කැබ් රථයක් ප්‍රසම්පාදනයේදී වැට් රහිත උපරිම මාසික බදු කුලිය එක් වාහනයකට රු.165,000 ක් ලෙස දක්වා තිබුණ ද, කාර්යාංශය විසින් මාසික බදු කුලිය රු.240,000 බැගින් ගෙවීම සඳහා කැබ් රථයක් ප්‍රසම්පාදනය කිරීම තුළ 2023 වර්ෂයේ අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා රු.675,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |
| **(උ)** | රු.2,914,000 ක් ගොඩවෙල පේෂකර්ම මධ්‍යස්ථානයේ අපජලය පිරිපහදු පද්ධතිය නවීකරණය කිරීමට අදාළව කාර්යාංශය හා කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 සැප්තැම්බර් 21 දින එළඹි ගිවිසුම් ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය 2021 නොවැම්බර් 20 වන දින අවසන් කිරීමට නියමිතව පැවතියත්, අදාළ කාර්යය නියමිත පරිදි ඉටුකර එම පද්ධතිය ක්‍රියාකාරී මට්ටමට ගෙන ඒමට කර්මාන්ත සේවා කාර්යාංශය අපොහොසත් වීම හේතුවෙන් දෙපාර්ශවයේ එකඟතාවය මත අවසන් ගෙවීමකින් තොරව මෙම කාර්යය අවසන් කර තිබුණි. මීට අදාළව විගණිත දිනය වනවිට කාර්යාංශයට ලැබී තිබූ ආදායම රු.2,039,800 වුවද, 2021 වර්ෂයේ සිට 2023 දක්වා රු.2,495,023 ක වියදමක් දරා තිබුණි. ඒ අනුව මෙම ව්‍යාපෘතිය මඟින් කර්මාන්ත සේවා කාර්යාංශය වෙත රු.455,223 ක අලාභයක් වී තිබුණි. | දෙපාර්ශවයටම ගැටළුවක් හෝ බාධාවක් නොවන පරිදි අදාළ කර්තව්‍යය දෙපාර්ශවයේම එකඟතාවයෙන් නිම කිරීමට හැකි වූ අතරම, එමගින් අප ආයතනයට කිසිදු මූල්‍යමය පාඩුවක් සිදුනොවීමට අදාළ නිලධාරීන් වග බලා ගෙන ඇත. එසේ වුවද මෙම කාර්යය මගින් ආයතනයට කිසිදු මූල්‍යමය වාසියක් ද ඇති නොවූ බව දන්වා ඇත. | ගිවිසුම්ගත වීමට ප්‍රථම ආයතනයේ හැකියාව හා ශක්තිය පිළිබඳව සැහීමකට පත්විය යුතුය. |
| **(ඌ)** | කර්මාන්ත සේවා කාර්යාංශයට අයත් මෝටර් රථයක් අපහරණය කිරීම සඳහා වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය මඟින් 2022 සැප්තැම්බර් 28 දින තක්සේරු වටිනාකම රු.3,500,000 ක් බවට තීරණය කර තිබුණි. වාහනයේ සාමාන්‍ය තත්ත්වය (GeneralCondition) යටතේ සිසිලන පද්ධතිය (Cooling system) සතුටු දායක බවට තක්සේරු කර තිබියදී, 2022 වර්ෂයේ මෝටර් රථයේ වායු සමීකරණයන්ත්‍රය අලුත් වැඩියා කිරීම ඇතුලු වෙනත් අලුත්වැඩියාවක් සඳහා එකතුව රු.150,470 ක් කර්මාන්ත සේවා | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව භාවිතයට ගත නොහැකි තත්ත්වයේ තිබුණු HV 9875 අංක දරන වාහනය අපහරණය කිරීමට තීරණය කර තිබූ අතර, ඒ සඳහා විගණනයේදී පෙන්වා දුන් පරිදි මාස කිහිපයක් ගත වූ බව පිළිගෙන ඇත. පළමු තක්සේරු වාර්තාව ලබාගත් දින සිට සැලකිය යුතු ධාවනයක් සිදුකල නිසාත්, නැවත ටෙන්ඩර් කැඳවීම සඳහා වැය වන මුදල ද සැලකිල්ලට | වත්කම් අපහරණයට ප්‍රථමයෙන්, අපහරණය කළ යුතු වත්කම් මොනවාද යන්න පැහැදිලිව හඳුනාගත යුතු අතර භාවිතයට ගත හැකි තත්ත්වයේ පවතින වත්කම් හැකිතාක් ප්‍රයෝජනයට ගතයුතු මෙන්ම අපහරණයද ආයතනයට වඩාත් |

| | | |
|---|---|---|
| කාර්යාංශය විසින් වැය කර තිබුණි. ඒ අනුව වාහනය තක්සේරු කරනු ලැබූ අවස්ථාවේ පැවති තත්ත්වය මත අපහරණ කටයුතු සිදු නොකර අමතරව රු.150,470 ක වියදමක් දැරීමෙන් පසුවද රු.3,283,766 ක මුදලකට විකිණීම හේතුවෙන් රු.216,234 ක පාඩුවක් සිදුව තිබුණි. | ගෙන ටෙන්ඩර් කමිටු අනුමැතියට යටත්ව එකී මුදලට HV 9875 අංක දරණ වාහනය අපහරණය කළ බව ද දන්වා ඇත. | වාසිදායක වන ආකාරයෙන් සිදුකළ යුතුය. |

**1.5.30 වයඹ සංවර්ධන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ------------------------------------ | ------------ |
| (අ) | වයඹ සංවර්ධන අධිකාරියට අයත් ගොඩනැගිල්ලේ පවත්වාගෙන යනු ලබන හෝටල් පාසැලට වර්ෂ 02 කට බදු දීමේදී තක්සේරු වාර්තාවක් නොගෙන මාසික රු.200,000 කට බදු ගිවිසුමකට 2021 දෙසැම්බර් 27 දින භාණ්ඩ උපකරණ සහිතව බදු දී තිබුණු අතර, 2022 ජනවාරි 10 දින භාණ්ඩ උපකරණ සහිතව ගොඩනැගිල්ලේ මාසික කුලිය රු.360,000 ක තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර තිබුණි. එබැවින් 2022 හා 2023 වර්ෂ වෙනුවෙන් තක්සේරු කුලියට වඩා අඩු මුදලට ගිවිසුම්ගත වීමෙන් 2022, 2023 වර්ෂය වලට අදාළව වයඹ සංවර්ධන අධිකාරියට සිදු වූ මුළු අලාභය රු.3,840,000 ක් විය. | රජයේ තක්සේරු වාර්තාවට අනුව රු.360,000 ක් මුදලක් තක්සේරු කර තිබුණ ද, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන විසින් සිදු කරනු ලබන සේවාවන් සැලකිල්ලට ගනිමින් ඔවුන් විසින් සියයට 25 ක පාඨමාලා පවත්වාගෙන යාමෙන් වයඹ පළාත ඇතුළු අනෙකුත් පළාත් වල සිසුන්ට තම වෘත්තිය හැකියාවන් වර්ධනය කර ගැනීමට මහඟු අවස්ථාවක් ලැබී ඇත. තවද මෙම පරිශ්‍රයට අදාළ ආරක්ෂක වියදම් විදුලි හා අනෙකුත් සුළු නඩත්තු කටයුතු ඔවුන් විසින් පවත්වාගෙන යන බැවින් බදු කුලිය ලෙස රු.280,000 ක් මුදලක් ගෙවන ලෙස දන්වා ඇත. | ආයතන අදාළ වත්කම් තෙවන පාර්ශවයක් වෙත පැවරීමේදී රජයේ තක්සේරුවක් ලබා ගැනීමෙන් පසුව ආයතනයට අලාභයක් සිදුනොවන පරිදි ගිවිසුම් ගත වීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 1993 සැප්තැම්බර් 16 දිනැති 1993 අංක 01 දරන වයඹ සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තියේ සඳහන් අරමුණු 10 අතරින් කිසිම කටයුත්තක් මෙම ආයතනයෙන් සිදුකර නොතිබුණි. | පෙර පැවති කාර්යයන් වලට අදාළව අරමුණු සකස් කර ඇති අතර මෙම අරමුණු සංශෝධිත ප්‍රඥප්තිය අනුව වෙනස් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.5.31 වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------------------ | ------------ |
| කුලී ගාස්තු, වාහන අලුත්වැඩියා ගාස්තු, සේවා මධ්‍යස්ථාන ගාස්තු හා සිවිල් වැඩ ගාස්තු ලෙස ලැබිය යුතු ශේෂයන්ගේ සමාලෝචිත වර්ෂය | මෙම මුදල් ගිණුම් වලින් ඉවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම පිණිස වයඹ ප්‍රධාන අමාත්‍යාංශය | හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවසානයට එකතුව රු.63,212,432 ක් වූ අතර එම ශේෂය තුළ වසර 05 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොකර පවතින ණය ශේෂවල වටිනාකම රු.10,427,151 ක් විය | මගින් කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු වාර්තාව ලැබූ පසු එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. | |

**1.5.32.මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ------------------------------------- | ------------ |
| (අ) | 2013 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව අධිකාරිය වෙත ලැබිය යුතු මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු රු.13,490,500 ක් හා ප්‍රමාද ගාස්තු රු.2,706,150 ක් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | මෙම මුදල් ගිණුම් වලින් ඉවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම පිණිස වයඹ ප්‍රධාන අමාත්‍යාංශය මගින් කමිටුවක් පත්කර ඇති අතර එම කමිටු වාර්තාව ලැබූ පසු එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. | ලැබිය යුතු මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලැබිය යුතු අමතර ගමන්වාර ආදායම් රු.2,863,000 ක් හා ප්‍රමාද ගාස්තු රු.798,800 අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අමතර ගමන්වාර ආදායම රු.2,863,150 ක් හා ප්‍රමාද ගාස්තු රු.798,800 ක ශේෂයෙන් 2024 මාර්තු 31 දිනට අමතර ගමන්වාර ආදායම රු.151,000 හා ප්‍රමාද ගාස්තු 34.100.00 ක් අය වී ඇත. | ලැබිය යුතු අමතර ගමන්වාර ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2013 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් දක්වා ලැබිය යුතු පිවිසුම් පත්‍ර ආදායම් රු.2,162,900 ක් හා ප්‍රමාද ගාස්තු රු.390,750 ක් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි | 2013 වර්ෂයේ සිට 2023.12.31 දිනට ලැබිය යුතු පිවිසුම් පත්‍ර ආදායම රු2,162,900 ක් හා ප්‍රමාද ගාස්තු රු.390,750 ක ශේෂයෙන් හලාවත බස් සමාගම් වලට අයත් අන්තර් පළාත් බස්රථ වලින් අය කර ගත නොහැකි ශේෂය රු.451,000 හා ප්‍රමාද ගාස්තු රු.45,100 ක්ව පවතී.ඉතිරි රු.1,711,900 හා ප්‍රමාද ගාස්තු රු.345,650.00ක මුදලින් 2024 මාර්තු 31 දිනට පිවිසුම් පත්‍ර ආදායම රු.31,900.00 හා ප්‍රමාද ගාස්තු රු. 5,950ක් අය වී ඇත. | ලැබිය යුතු ආදායම අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | 2011 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ලැබිය යුතු නව බලපත්‍ර ගාස්තු ආදායම රු.3,621,000 අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ලැබිය යුතු නව බලපත්‍ර ගාස්තුවෙන් 2024 මාර්තු 31 දින වන විටත් රු.825,000 ක් අය වී ඇත. 2011 වර්ෂයේ සිට 2020 | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වර්ෂය දක්වා අයවිය යුතු රු.2,096,000 අදාල මාර්ග බලපත්‍ර අවලංගු තත්ත්වයේ පවතී. | |
| **(ඉ)** | සමාලෝචිත වර්ෂය අවසන් වන විට ලියාපදිංචි බස්රථ සංඛ්‍යාව 1374 ක් වුවද ලියාපදිංචි රියදුරු සංඛ්‍යාව 882 ක් හා ලියාපදිංචි කොන්දොස්තරවරුන් සංඛ්‍යාව 816 ක් වූයෙන් රියදුරන් 492 ක් හා කොන්දොස්තර මහතුන් 558 දෙනෙකු ලියාපදිංචි කරවා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් අධිකාරියට උපයාගත හැකිව තිබූ රු.1,575,000 ක ආදායමක් උපයාගැනීමට නොහැකිව තිබුණි. | 2024 අප්‍රේල් 26 දිනට වන විට ලියාපදිංචි රියදුරන් සංඛ්‍යාව 955 ක් ද 2024 අප්‍රේල් 26 දිනට ලියාපදිංචි කොන්දොස්තර මහතුන් සංඛ්‍යාව 905 ක් ලෙස වර්ධනය වී ඇත. ඉදිරියේදී තවදුරටත් වර්ධනයට පියවර ගන්නා බව දන්වා ඇත. | කොන්දොස්තරවරුන් ලියාපදිංචි කිරීමට අදාල කටයුතු කල යුතුය. |
| **(ඊ)** | 1995 අංක 04 දරන මාර්ගස්ථ මගී සේවා ප්‍රඥප්තියේ 28 ජේදය ප්‍රකාරව යම් තැනැත්තෙකු වෙත නිකුත් කරනු ලැබූ මගී සේවා අවසර පත්‍රයක් වෙනත් පුද්ගලයෙකු වෙත පවරනු ලැබිය නොහැකි අතර එසේ පැවරීමක් ශූන්‍ය හා බලරහිත වන්නේය යනුවෙන් දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය තුළ රු.50,250,000 ක් වටිනා බලපත්‍ර 112 ක් වෙනත් පාර්ශවයන් වෙත පැවරීමට කටයුතු කර තිබුණි. | 2018 අංක 07 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය අනුව අයිතිය විධිමත් කිරීම සඳහා බලය පැවරී ඇති බව දන්වා ඇත. | බලපත්‍ර යාවත්කාලීන කරවා ගැනීමට හෝ කල් ඉකුත් වූ බලපත්‍ර අවලංගු කර ඒ වෙනුවට නව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කල යුතුය. |
| **(උ)** | 1995 අංක 04 දරන වයඹ පළාත් මාර්ගස්ථ මගීසේවා ප්‍රඥප්තියේ 24 (2) (ආ) ජේදය ප්‍රකාරවම ගීසේවා අවසර පත්‍රයක වලංගු කාලය වර්ෂයක් හා 30 (ආ) ජේදය ප්‍රකාරව අවසර පත්‍රය අවංලගු වන දින සිට මාස 12 ක කාලයක් සඳහා එම බලපත්‍ර අලුත්කල හැකි බව දක්වා තිබුණද 2019 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් මස දක්වා වලංගු කාලය ඉක්ම වූ බලපත්‍ර 102 පැවති අතර එම බලපත්‍ර කල්ඉකුත් වී වර්ෂ 01 සිට 03 දක්වා කාලයක් ගතවුවද අළුත්කරගැනීමට කටයුතු නොකිරීමෙන් රු.836,250 ක ආදායමක් අහිමි වී පැවතුණි. | 1995 අංක 4 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා ප්‍රඥප්තිය අනුව අධිකාරිය පිහිටවූ දින සිට මේ දක්වා අයිතිය විධිමත් කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක වූ අතර එමඟින් විශාල ආදායමක් මේ වන විට අධිකාරිය විසින් උපයාගෙන ඇත. | බලපත්‍ර යාවත්කාලීන කරවා ගැනීමට හෝ කල් ඉකුත් වූ බලපත්ර අවලංගු කර ඒ වෙනුවට නව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කල යුතුය. |
| **(ඌ)** | පළාත තුළට පිවිසෙන අන්තර් පළාත් බස්රථ සඳහා ලොග්පත් හා පිවිසුම් ගාස්තු අයකිරීමට අදාළ ප්‍රතිපාදන 1995 අංක 04 දරන වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරි ප්‍රඥප්තියට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් හලාවත හා කුලියාපිටිය බස්නැවතුම්පල හරහා ගමන් කරන අන්තර් පළාත් බස්රථ වලින් එකී ගාස්තු අයකරගැනීමට නොහැකිව පැවති අතර, 2013 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කුලියාපිටිය හා හලාවත බස්නැවතුම්පල වලට අදාළව අයකරගැනීමට නොහැකිව | 1995 අංක 04 දරන ප්‍රඥප්තියෙන් නිතීමය පසුබිම සැකසි නොතිබුණු බැවින් මෙම ශේෂ අයකරගැනීමට නොහැකිව ඇත. 2018 අංක 07 දරන නව ප්‍රඥප්තියෙන් ඒ සඳහා නීතිමය පසුබිම සැකසී ඇත. | අයවිය යුතු ශේෂ අයකරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පවතින ලොග්පත්‍ර ගාස්තු හා පිවිසුම් ගාස්තු පිළිවෙලින් රු.6,148,000 ක් හා රු.451,000 වන අතර ඊට අදාළව අය නොවූ දඩ මුදල රු.889,500 ද ඇතුළු අයවිය යුතු මුදල රු.7,516,500 ක් විය. | | |
| **(එ)** | අධිකාරියේ කටයුතු විනිවිද භාවයකින් හා විධිමත්ව පවත්වාගෙන යාම වෙනුවෙන් 2018 සැප්තැම්බර් 15 දින කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යනාංශය සමඟ ගිවිසුම්ගතව රු.13,589,198 ක වියදමක් දරා ස්ථාපිත කරනු ලැබූ පරිගණක පද්ධතියේ නඩත්තු හා සේවා කටයුතු සම්බන්ධයෙන් එම පද්ධතිය ස්ථාපනය කල කොළඹ විශ්ව විද්‍යාලයේ පරිගණක අධ්‍යානාංශය සමඟ සේවා ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණු අතර එම ආයතනය කාර්යය නිමකිරීමෙන් අනතුරුව සේවා කටයුතු වෙනුවෙන් ඉහල සේවා ගාස්තු ඉල්ලුම් කිරීමට කටයුතු කර තිබුණි. | පරිගණක පද්ධතියේ නඩත්තු හා සේවා කටයුතු සඳහා කොළඹ විශ්ව විද්‍යාලය සමඟ සේවා ගිවිසුමකට පැමිණ නොමැති බැවින් මේ පිලිබඳව කමිටුවක් පත් කර එම වාර්තාව කොළඹ විශ්ව විද්‍යාලය වෙත යොමු කරන ලදි. ඒ අනුව අදාල මෘදුකාංගයට අදාල ඉදිරි නඩත්තු හා සේවා කටයුතු සම්බන්ධව මහාචාර්යවරයෙකු වෙත ලබා දීමට නිර්දේශ කර ඇති බැවින් ඉදිරියේදි මේ සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ | කඩිනමින් හා විධිමත්ව සේවා ගිවිසුමට එළඹිය යුතු අතර ඉදිරි සංවර්ධන කටයුතු වලදී ප්‍රසම්පාදන අවස්ථාවේදීම සේවා ගිවිසුම් සඳහාද අවශ්‍ය කටයුතු කල යුතුය. |
| **(ඒ)** | 2011 වර්ෂයේ අවස්ථා දෙකකදී පුවත්පත් දැන්වීම මඟින් ටෙන්ඩර් කැඳවා රු.19,287,700 ක් වටිනා මාර්ග බලපත්‍ර 40 ක් වර්ෂ 05 ක වලංගු කාලසීමාවක් සඳහා ලබාදීමට කටයුතු කර තිබුණු අතර එම බලපත්‍රවල වලංගු කාලසීමාව 2016 වර්ෂයෙන් අවසන් වූ පසු 2016 හා 2021 වර්ෂ වලදී නැවත ටෙන්ඩර් කිරීම තුලින් රු.38,575,400 කට ආසන්න මුදලක් උපයාගත හැකිව තිබුණද එම බලපත්‍ර 40 හෝ නැවත ටෙන්ඩර් කිරීමට කටයුතු කර නොතිබුණි**.** | 2011 වර්ෂයේ මාර්ග බලපත්‍ර ලබාදීමට අදාලව පළ කරන ලද පුවත් පත් දැන්වීමේ මෙම බලපත්‍ර වල වලංගු කාළය වසර 5 ක් ලෙස සඳහන් කර ඇත. නමුත් මාර්ගස්ථ මගී සේවා ප්‍රඥප්තියේ හෝ රීති මාලාවේ මාර්ග බලපත්‍රවල වලංගු කාළය වසර 05 කට සීමා විය යුතු බවට කොන්දේසි පැනවීමට අදාලව ප්‍රතිපාදන නොමැති අතර 2016 වර්ෂයෙන් පසු නව බලපත්‍ර ටෙණ්ඩර් කිරීමේදි මෙම කොන්දේසිය ඉවත් කර ඇත. | බලපත්‍ර ටෙන්ඩර් කිරීම හා බලපත්‍ර වල වලංගු කාලය සම්බන්ධයෙන් රීති සකස් කරගත යුතුය. |
| **(ඔ)** | රියදුරු අභ්‍යාස විද්‍යාලයේ පුහුණු කටයුතු වෙනුවෙන් 2006 වර්ෂයේ මිලදීගෙන තිබූ තක්සේරු වටිනාකම රු.1,500,000 වන අශෝක් ලේලන්ඩ් වර්ගයේ බස් රථය බර වාහන පුහුණුකරුවකු නොමැතිවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පුහුණු කටයුතු සඳහා යොදා නොගෙන අධිකාරි භූමියේ ගාල්කර පැවතුණි. | මේ වන විට උපදේශකවරු දෙදෙනෙකු සේවය සඳහා යොදවා ගෙන ඇති අතර ඉදිරියේදී බර වාහන රියදුරු බලපත්‍ර ලබාදීම සඳහා අවශ්‍ය උපදේශකවරයෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.<br>රියදුරු අභ්‍යාස විද්‍යාලයට අයත් බස්රථය මගින් දැනට බර වාහන පුහුණු කිරීම උපදේශක හිගය මත තාවකාලිකව නතර කර ඇති නමුත් එම බස් රථය මගින් දැනට රාජ්‍ය අංශයේ,පෞද්ගලික අංශය හා පුද්ගලයින් සඳහා විශේෂ | නිශ්කාර්යව පවතින බස් රථය ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතු විය. |

| | | | |
|---|---|---|---|
| | | වාරිකා සඳහා කුලී පදනම මත ලබාදීම මගින් අමතර ආදායම් උත්පාදනය කිරීම මේ වන විටත් සිදු කරනු ලැබේ. | |
| **(ඕ)** | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ හිටපු සභාපතිවරයාගෙන් අයවිය යුතු රු.1,156,506 ක මුදල අයකරගැනීමට 2022 ජූලි 02 දිනැති NWP/MORD/ACC/01/24/5 දරන අමාත්‍යාංශ ලේකම්ගේ ලිපියෙන් උපදෙස් ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම මුදල අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කරන ලද අතර හිටපු සභාපති විසින් අදාල කාලයන්හි KX-6392 වාහනය ධාවනය වූ ධාවන විස්තර විගණනය වෙත ඉදිරිපත් කර ඇත. | අයවිය යුතු වටිනාකම අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| **(ඖ)** | 2014 සැප්තැම්බර් 11 දින පැවති ගිණුම්කාරක සභාවේදී මාර්ග බලපත්‍ර ලබාදීමට එක් විධිමත් ක්‍රමවේදයක් තෝරා ගැසට් කරන ලෙස දන්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම තීරණය ලබාදී වසර 08 ක් ගතවුවද එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේ සිට මාර්ග බලපත්‍ර ටෙන්ඩර් ක්‍රමයට ලබාදෙනු ලැබේ. | ටෙන්ඩර් ක්‍රමයට අමතරව අයිතිය විධිමත් කිරීමටද කටයුතු කර ඇති බැවින් එක් විධිමත් ක්‍රමයක් තෝරා රිති සකස් කරගෙන ඇත. |

**1.5.33. ධීවර සවිය චක්‍රීය අරමුදල**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | ධීවර සවිය චක්‍රීය ණය අරමුදල ආරම්භ කිරීමට ප්‍රඥප්තියක් මගින් හෝ රීති මාලාවක් මගින් හෝ අනුමැතියක් නොමැතිව 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණි | 2024 මාර්තු 13 දිනැතිව අනුමත කරන ලද රීති මාලාව මේ සමග ඉදිරිපත් කරන බවත්, මූල්‍ය ප්‍රකාශන සමග එම ගිණුම් පිළියෙල කිරීමට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීම් 2024 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| **(ආ)** | ධීවර සවිය චක්‍රීය ණය අරමුදල මගින් ලබාදුන් ණය යටතේ යම් නිශ්චිත දිනකට කල් ඉකුත්වූ හෝ අයවීමට හිඟ හිට ඇති ණය පිළිබඳව තොරතුරු හඳුනාගැනීමක් සිදුකර නොතිබුණ අතර, මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ධීවර සවිය චක්‍රීය ණයගැති ශේෂය රු.16,432,416 ක් විය. | ණයගැතියා බැංකුව වෙත ණය පියවීම් සිදු කළත් නොකළත් අදාල කාර්තුව අවසානයේ ප්‍රතිමූල්‍ය ණය පොලිය හා වාරික චක්‍රීය ණය අරමුදල් ගිණුම වෙත බැර කෙරේ. නියමිත මුදල් ගිණුමට අදාල කල සීමාව තුළ බැර වී තිබේද යන්න තහවුරු කර ගැනීමට සුදුසු ක්‍රමවේදයන් අමාත්‍යාංශ මට්ටමින් සකස් කරමින් පවතින අතර අවශ්‍ය වූ වහාම විගණනයට වාර්තා කරන බව දන්වා ඇත. | ණය වාරික හා පොලිය නියමිත පරිදි ලැබෙනවාද යන්න තහවුරු කරගත යුතුය. |

### 1.5.34.කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන චක්‍රීය අරමුදල

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් මූල්‍ය රීති 151.1 ට අනුව සියළුම ගෙවීම් සඳහා ගෙවීම් වවුචර් ඉදිරිපත් කළයුතු බව දන්වා තිබුණද චක්‍රීය අරමුදලේ කළමනාකාරීත්වය විසින් ගෙවීම් වවුචර් පිළියෙල නොකර සමාලෝචිත වර්ෂය තුළදී රු.273,475 ක වියදම් සඳහා ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි. | 2024 වර්ෂයේ සිට සිදු කරනු ලබන සියළු වියදම් සඳහා වව්චර්පත් පිළියෙල කිරීම ආරම්භ කර ඇති බවත් ඉදිරියේදි සියළු ගෙවීම් සඳහා වව්චර් පිළියෙල කිරිම සිදුකරන බව දන්වා ඇත. | පළාත් මූල්‍ය රීති 151.1 ප්‍රකාර සියළුම ගෙවීම් සඳහා වවුචර් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ චක්‍රීය ණය යෝජනා ක්‍රමය සඳහාවූ රීති මාලාවේ අංක 03 යටතේ චක්‍රීය ණය යෝජනා ක්‍රමයේ අරමුණු 11 ක් දක්වා ඇති අතර, ඉන් අරමුණු 08 ඉටුකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන චක්‍රීය ණය අරමුදල සඳහා වන අරමුණු දිගුකාලීන අරමුණු වන අතර මේ වන විට එම අරමුණු ඉටුකරගැනීම සඳහා අවශ්‍ය මූලික පියවරයන් සිදුකර ගෙන යමින් පවතින බව දන්වා ඇත. | චක්‍රීය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.35.වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදල

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා වයඹ පළාතේ වාර්ෂිකව නඩත්තු කළයුතු වැව් ලෙස කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 46 හි වැව් 1092 ක් හඳුනාගෙන එම එක් එක් වැව වෙනුවෙන් සකස් කරඇති ඇස්තමේන්තු අනුව නඩත්තු කිරීමට යන මුළු පිරිවැය රු.25,818,424 ක් වූයෙන් 2014 අංක 02 දරන වාරිමාර්ග ප්‍රඥප්තියේ III වැනි පරිච්ඡේදයේ 35 (1) වගන්තිය ප්‍රකාර ඇස්තමේන්තු පිරිවැයෙන් සියයට 50 ක් එනම් රු.12,909,212 ක මුදල් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදලින් ගෙවිය යුතු වුවත්, මූල්‍ය ප්‍රකාශනවල නඩත්තු වියදම් ලෙස රු.1,911,051 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි මූල්‍ය කාර්ය සාධනයේ ප්‍රගතියක් නඩත්තු අරමුදල් ගිණුමෙන් නොපෙන්වන බැවින් මින් ඉදිරියට පුනරාවර්තන වැය විෂයන්ගෙන් ලැබෙන මුදල් මෙම අරමුදලේ ආදායම් ලෙස ගිණුම් ගත කරමින් අදාළ වර්ෂය තුළම වියදම් දැරීමට කටයුතු කරන බව දන්වා ඇත. තවද, 2024 වර්ෂයේ මූල්‍ය වාර්තාවලින් නිවැරදි කිරීමට ද සටහන් කර ගත් බවද දන්වා ඇත. | ගණුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ ගෙවිය යුතු සුළු වාරිමාර්ග නඩත්තු වියදම් රු.16,415,846 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ ඉන් රු.6,307,142 ක් පමණක් මුදලින් | 2024 වර්ෂයේ සිට නියමිත කාලවකවානුවල ගෙවීම් කිරීමට අදාල ව සියළු නිලධාරින් දැනුවත් කර ඇති අතර, ඒ අනුව ගෙවීම් | ගෙවියයුතු සුළු වාරිමාර්ග නඩත්තු වියදම් නිසි පරිදි වාරි කළමනාකරණ හා |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් සිදුකර තිබුණු අතර, රු.10,108,704 ක්වූ ඉතිරි ශේෂය පෙර වර්ෂයේ සමුච්චිත අරමුදලට නිසි අධිකාරී බලයකින් තොරව ගලපා තිබුණි. | කිරීමට කටයුතු කරනු ලැබේ. තවද, 2022 වර්ෂයේ ගෙවිය යුතු ශේෂ අධි තක්සේරුවක් වී ඇති බැවින්, ගිණුම් නිවැරදි කිරීමට සමුච්චිත අරමුදලට ගැලපීම් සිදු කලද අතපසුවීමකින් ඒ සඳහා නිසි අධිකාරී බලය ලබා ගැනිමට නොහැකි වී තිබූ අතර විගණනයෙන් පෙන්වා දීමෙන් පසු අදාල අධිකාරී බලය ලබාගෙන ඇති බව දන්වා ඇත. | සංවර්ධන කමිටු වෙත නියමිත පරිදි ලබාදිය යුතුය. |
| **(ඇ)** | 2014 අංක 2 දරන වාරිමාර්ග ප්‍රඥප්තියේ සඳහන් අරමුණු වෙනුවෙන් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදලින් මුදල් උපයෝජනය කර නොගෙන සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ස්ථාවර තැන්පතුවල එකතුව රු.56,416,541ක් ආයෝජනය කර තිබුණි | 2014 අංක 02 දරණ වාරිමාර්ග ප්‍රඥප්තියට අනුව ප්‍රඥප්තියේ අරමුණු ඉටුකර ගැනීමට ඇති ආදායම් මාර්ග අවහිර වී ඇති හෙයින් හදිසි ආපදා නඩත්තු ගෙවීම් වෙනුවෙන් මෙම අරමුදල් යෙදවීම සඳහා ආයෝජනය කර ඇති බව දන්වා ඇත. | ප්‍රඥප්තියට අනුකූලව අදාල අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.36 සමුපකාර සංවර්ධන අරමුදල**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | -------------------------------------- | ------------ |
| **(අ)** | නාත්තන්ඩිය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2021 හා 2022 හා 2023 වර්ෂයන්හි දී මෙම අරමුදලින් රු.72,635,253 ක් වැය කළ ද ඉඩමේ නිත්‍යානුකූල අයිතිය අරමුදල වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නාත්තන්ඩිය පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම සමුපකාර අමාත්‍යාංශය සතු වන අතර එම ඉඩමේ අයිතිය පවරා ගැනීමේදී පරිපාලන ගැටලුවක් පැනනැගී ඇති බැවින් හා එම ඉඩම පවරා ගැනීම හා ප්‍රාග්ධන වත්කම් ඉදිකිරීම සඳහා දරන ලද වියදම් ආයතනය සමුපකාර අරමුදලේ වත්කමක් ලෙස ගිණුම් ගත කිරීම සඳහා ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව සඳහන් කර ඇත. | කඩිනමින් අයිතිය පවරාගෙන වත්කමේ වටිනාකමට ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | අරමුදල මගින් සමුපකාර සමිති 15 ක් වෙත ණය ලබාදී 2023 දෙසැම්බර් 31 දිනට මාස 21 ත් මාස 220 ත් අතර කාලයක් ගතව පැවතියද, ඒ වෙනුවෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය වූ රු.51,588,060 ක වටිනාකම අය වී නොතිබුණි. | පිළිගනිමි. | හිඟ ණය ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |